
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ ඇසළ පුර අටවක පෝදා 2022 ජූලි 07 බ්‍රහස්පතින්දා BUDUSARANA THURSDAY JULY 07, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 04 පත්‍රය , පිටු 12 ආරම්භය 1965 - 06 - 13



මහිලාමුඛ ජාතක කතාව ඇසුරිනි

# සොරකමට දුන් අපූරු දඬුවම

**මහා තළාක විහාරවාසී අභය තෙරුන්ගේ කතාව**

**සිංහල දිවයිනේ මහා තළාක නම් විහාරයක් විය. ධර්මධර, විනයධර අභය නම් ඇති මහ තෙරනමක් එහි වාසය කළහ. උන්වහන්සේ ගමේ පන්සල අත්හැර භාවනාවට සඳහා වන ලැහැබකට ගොස් කුඩා පන්සලක් ද හදාගත්තා.**



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

මහා කැලෑවක හුදකලාව භාවනාවේ යෙදුණු නිසා 'අරණ්‍යක මහා අභය තෙරුන් වහන්සේ' යැයි නොබෝ කලකින් ම ප්‍රසිද්ධ වුණා. එක් උපාසකයෙක් දවසක් උන්වහන්සේ හමුවී බණ අසා පැහැදී අවසර ඉල්ලාගෙන අවුරුදු දොළහක් සිවුපසයෙන් උපස්ථාන කළා. තෙරුන් වහන්සේගේ ප්‍රයෝජනයට කලින් කලට වස්ත්‍ර ද පූජා කළා.

උපාසකගේ නිවස සමීපයේ ම ජීවත් වුණු 'හරන්තික' නම් පුද්ගලයෙක් රාත්‍රියේ ආරාමයට ගොස් ඒ සිවුරු සොරකම් කරන්න පුරුදු වුණා. තෙරුන් වහන්සේ හැමදාම එකම සිවුර පරිහරණය කළා.

උපාසකයාත් වෙන වර්ෂවල වගේ ම තෙරුන් වහන්සේගේ පරණ සිවුරු දැක සිවුරක් මසාගන්න වස්ත්‍රයක් පූජා කළා 'මම හැම වර්ෂයක ම මුන්වහන්සේට සිවුරු සකසා ගන්න බොහෝ වස්ත්‍ර දුන්නා. ඒත් අලුත් සිවුරක් සකසාගෙන පොරවන්නේ නෑ. හැමදාම පරණ සිවුරම තමයි. හැම තැනින්ම පලුදු වෙලා. දිරා ගිහිල්ලා.

එහෙම තියෙද්දිත් ඇයි අලුත් සිවුරක් හදා ගන්නේ නැත්තේ. අවුරුදු දොළහක් තිස්සේ ම මම සිවුරු මහගන්න රෙදි දුන්නා. ඒත් එකම අවුරුද්දක්වත් අලුත් සිවුරක් පොරවනවා මම දැකලා නෑ. මේ වතාවේ නම් කල්පනාකාරීව හොයල බලන්න ඕන. පූජා කරන රෙදිවලට මොකද වෙන්නේ කියලා"යි කල්පනා කරන්න පටන් ගත්තා.

සිවුරු රෙදි පූජා කළ දවසේ තෙරුන් වහන්සේ වැඳ ''ස්වාමිනි, වතාවත් සියල්ල අවසන් කළා. හෙට පාන්දරින් දානයත් අරගෙන එන්නම්' යැයි පවසා තෙරුන් වහන්සේට වැඳ ආරාමයෙන් නික්මුණා. අසල වන ලැහැබක සැඟවී පූජා කළ රෙදිවලට කුමක් සිදුවන්නේ දැයි පරීක්ෂා කරමින් සිටියා. රාත්‍රිය උදාවෙමින් තිබුණා.

කිසිදු කෙනෙක් පැමිණියේ නෑ. තෙරුන් වහන්සේ වස්ත්‍රය බලන්නේවත් නැතිව භාවනා කරමික් කාලය ගත කළා. උපාසකයාටත් බොහෝම වෙහෙසයි දැන්. ඒත් සොරෙක් හෝ මේ වස්ත්‍රය ගෙනයන කවුරුන් හෝ කෙනෙක් සිටීද? නැත්නම් එයට සිදුවන්නේ කුමක්දැයි කල්පනා කරමින් සිටින විට හරන්තික පැමිණ තෙරුන් වහන්සේගේ ප්‍රමාදයක් බලා සිට වහාම කුටියට පිවිසුණා. වස්ත්‍රය අරගෙන සැඟවෙමින් සෙමෙන් සෙමෙන් යන්න පටන් ගත්තා.

උපාසකයාට දැන් පුදුම කේන්තියක්. ඔහු සොරා පසුපස එළවා ගොස් බෙල්ලෙන් අල්ලාගෙන 'ඒයි පාපියා, මෙතෙක් කල් මම තෙරුන් වහන්සේට දුන් වස්ත්‍ර ගත්තේ තොප නොවේද'යි කියමින් පහර දුන්නා. සොරාත් 'ඔව් මම තමයි' කියමින් වරද පිළිගත්තා.

සොරාට අත්පාවලින් පහර දී දුර්වල කොට අත තිබුණු වස්ත්‍රයෙන් ම අත්පා බැඳ දමා අමුසොහොනට ගෙන ගොස් මළ මිණියක් උඩුකුරු කොට මුදා ගත නොහැකි ලෙස ඔහුගේ පිටේ තබා බැඳ දැමුවා.

අනතුරුව ඔහු නිවසට ගොස් නා පිරිසුදුවීම මැදට ගිහින් 'මම කියන මේ පණිවිඩය හැමෝම අහන්න. අද රාත්‍රී කාලයේ එක් අමනුෂ්‍යයෙක් එනවා.

ඌ තොප හැමෝට ම විනාශය ගෙන එනවා. ඌ දුටුවහොත් සනීප කළ නොහැකි තරම් බියට පත් වෙනවා. ඔහුට පුළුවන් ඕනෑම පුද්ගලයකුගේ හඬක් අරගෙන කථා කරන්න. ඒ නිසා දොර-ජනෙල් හොඳින් වසා තබා ගන්න. කවර නමකින් කතා කළත්, කුමන නෑදෑකමක් ප්‍රකාශ කළත් දොරවල් අරින්න එපා. සමහර විට මම ඔයාගේ අසවල් යහළුවා, තාත්තා, පුතා, සහෝදරයා යැයි කියමින් දොර විවෘත කර ගන්න උත්සාහ ගනීවි. ඒ එකකටවත් රැවටෙන්න එපා.

කිසිම වචනයක් කතා කරන්න යන්න එපා"යි හඬගා කියමින් ගම පුරා ඇවිද ගියා. ගම් වැසියෝ ඒ කතාව අසා බියට පත් වුණා. වෙනදාටත් වැඩියෙන් දොර ජනෙල් ශක්තිමත්ව වසා දමා නින්දට ගියා. රාත්‍රිය ක්‍රමයෙන් උදා වුණා.

මළමිණිය මුදවා ගැනීමට සොරා උත්සාහ කළා. එහෙත් ලිහා ගැනීමට බැරි තැන බිරිඳගේ සහායෙන් එය මුදවා ගන්න පුළුවන් යැයි සිතා නිවසට ගොඩවී බිරිඳ අමතා 'මම හරන්තික දොර අරින්න'යි පැවසුවත් දොර ඇරියේ නෑ. පුතාටත්, දුවටත් කතා කළා. ඒත් දොර ඇරියේ ම නෑ. කිසිම ශබ්දයක් නෑ. ඔහු මහත් සේ දුකට පත් වුණා. දෙවැනියට අම්මලාගේ ගෙදරට ගියා 'අම්මේ මම හරන්තික දොර අරින්න. හදිස්සියකට ආවේ"යි

කියා සිටියා. ඒත් දොර ඇරියේ නෑ. තාත්තාටත් කතා කළා. උදව්වක් ලැබුණේ නෑ. සහෝදර සහෝදරියන්ගේ නිවෙස්වලට ගොස් කතා කළා. ඒත් දොර ඇරියේ නෑ. යහළුවන්ගේ, නෑයන්ගේ ගෙවල්වලටත් ගියා. ඔහුට කවුරුවත් පිහිට වුණේ නෑ. වචනයක්වත් කතා කළේ නෑ.

අවසානයේ ආරාමයේ වැඩ සිටින තෙරුන් වහන්සේ වෙත ගිහින් ''ස්වාමිනි, මම හරන්තික කියලා කෙනෙක්. මට පිහිට වෙන්න පුළුවන්ද? ඔබ වහන්සේට දොර අරින්න පුළුවන්ද? මම බොහොම අසරණ කෙනෙක්' යැයි කියා සිටියා.

තෙරුන් වහන්සේ ඒ වදන් අසා සිට 'මේ රාත්‍රී යාමයේ කවුරුන්ද මේ. පිහිටක් බලාපොරොත්තුවෙන් ම පැමිණියා වගෙයි. ඔහුගේ හඬෙහි තිබෙන්නේත් වෙහෙසට පත්වුණු බවක්" යැයි කල්පනා කරමින් දොර විවර කර එළියට පැමිණියා. ලාම්පු එළියෙන් ඔහුගේ ස්වභාවයත්, පිටේ බැඳ ඇති මළ මිණියත් දුටුවා.

සොරා හඬා වැටෙමින් සියලුම පුවත් දන්වා 'ස්වාමීනි, මම ඔබ වහන්සේගේ උපස්ථායකයා වෙන්නම්. දාසයා වෙන්නම්. සේවකයා වෙන්නම්. මේ මිණිය මුදවා මා සුවපත් කරන්න'යි ඉල්ලා සිටියා.

තෙරුන් වහන්සේ ඔහු දැක මහත් කම්පාවට පත් වුණා. අනතුරුව මහත් වූ කරුණාවෙන් මිණිය පිටෙන් ඉවත් කර ඈතට ගෙන ගොස් දැමුවා. ඔහුගේ වෙහෙස දුරුවීමට උණුපැන් සකසා ඇඟ සෝදා ගැනීමට පහසුකම් සැපයුවා.

ශරීරය පුරා තුවාල සිදු වී තිබුණා. ඒවාට කැලෑ බෙහෙත් සහ තෙල් ආදිය සකසාගෙන ආලේප කරන්න පටන් ගත්තා. රාත්‍රිය ක්‍රමයෙන් පහවෙමින් සූර්යාලෝකය උදාවෙන්න පටන්ගෙන තිබුණා.

උපාසක අමුසොහොනට ගොස් බැලුවා. හරන්තික එහි හිටියේ නෑ. ඔහුගේ ගෙදරට ගිහින් බැලුවා එහිත් හිටියේ නෑ. මෙසේ ගමේ ම ඇවිද ගියා. එහෙත් ඔහු ගැන කිසිදු ආරංචියක් ලැබුණේ නෑ. ''හරන්තික ගමේ කිසිම තැනක නෑ. ඔහු පන්සලේ නැත්නම් මහ වනයේ මැරිල ඇති.

මිනී මස් කෑමට එන වන සතුන් ඔහු මරා දමා ඇති.'යි සිතමින් හරන්තික පන්සලේ සිටී දැයි බන්න පන්සලට ගියා.

ඔහු යන විට තෙරුන් වහන්සේ හරන්තිකගේ තුවාලවලට බෙහෙත් බැඳ, පිටේ ඇති පහර දුන් තැන්වල තෙල් ගල්වා පිරිමදිමින් සිටියා. ඒ දැක තෙරුන් වහන්සේ අමතා 'ස්වාමිනි, සොරා නම් දුරු කළ යුතු පුද්ගලයෙක්. ඌ මේ මගේ යහළුවා, මේ මට උපකාර කළ කෙනා යැයි සිහි නොකරන කෙනෙක්. කළ උපකාර අමතක කරන කෙනෙක්. සොරා කටින් එකක් කියනවා. ශරීරයෙන් තව එකක් කරනවා. ඉඩ ලැබුණු ගමන් සොරකම් කරනවා. මව්පියනුත්, සහෝදර සහෝදරියනුත්, නෑදෑයිනුත්, යහළු යෙහෙළියනුත් සොරකම් කරන්නා පන්නා දමනවා. සොරා සමඟ ඇසුරක් පවත්වන්න බෑ.

'ස්වාමිනි, ඒ නිසා මේ හොරාට උදව් කරන්න එපා. මොහු පන්සලෙන් පන්නා දමන්න'යැයි පවසා සිටියා. උපාසකයාගේ කතාවට සවන් දුන් අරණ්‍යක මහා අභය තෙරුන් වහන්සේ 'උපාසකය, යම් බල්ලෙක් තමන්ගේ පාදය සපා කෑවා යැයි, ඒ පුද්ගලයා ඒ බල්ලාගේ පාද සපා කන්නේ නෑ.

ඒ වගේ සත්පුරුෂයෝ වරදක් කළ පුද්ගලයාට ද්වේෂ කරන්නේ නෑ. මෛත්‍රීය ඇති පුද්ගලයා අසත්පුරුෂයාට මෛත්‍රීය නො කරනවා නම් ඔහු මෛත්‍රිය කරන්නේ කාටද? හරන්තික කළ පාපී ක්‍රියාවට දැන් ඔහුට විපාකය ලැබී අවසානයි. තවත් ඔහුට බැන විදින්න එපා.

ඔබ ඔහුට දඬුවමක් පැනවූවා. එය හොදටම ඇති. 'පින්වත් උපාසකය, දැන් ඔබ යන්න' යැයි කියා සිටියා. කිහිප දවසකින් හරන්තික ශරීර ශක්තියෙන් වැඩී ගියා. සුවපත් වුණා.

තෙරුන් වහන්සේ වෙත එළඹ 'ස්වාමිනි, නැවතත් මට ගිහි ගෙයි වාසය කිරීමට ඇල්මක් නෑ. මා පැවිදි කරන්න' යැයි ඉල්ලා සිටියා. තෙරුන් වහන්සේත් ඔහුට මහණකමත්, උපසම්පදාවත් ක්‍රමයෙන් ලබා දුන්නා. වත්පිළිවෙත්වල හොඳින් නිරත වුණා. වීර්යය උපදවා භාවනා වැඩුවා. අවසානයේ අර්හත්භාවය ලබා හරන්තික තෙරුන් යැයි ප්‍රසිද්ධ වුණා.

මේ කතා පුවතින් පෙන්වා දෙන්නේ වස්තු සම්පත් කෙරෙහි ඇල්ම දුකට පත්කරවන බවයි. ජීවත්වීම විශාල දුකක් බවත්, නැවත උපතක් නො ලබන අයුරින් සසර නිමා කර ගැනීමට කුසලයෙහි යෙදීම පණ්ඩිතයන්ගේ ලක්ෂණයක් බවත් පෙන්වා දෙනවා. නොදැනුවත්කමින් වැරැදි කළත්, වැරැද්ද අවබෝධ කරගත් විට තමාටත්, සමාජයටත්, ලෝකයටත් ඔහුගෙන් සිදුවන සේවය ඉතා විශාලයි. ප්‍රමාණය කළ නොහැකියි.



# සසර මඟ සැපවත් කරන ප්‍රභාස්වර සිත

**“නානත්ත කායා නානත්ත සඤ්ඤා” සත්වයා නම් කයින් ද, සිතින් ද විෂම ය. ශාරීරික වශයෙන් සෑම දෙනාගේ ම මුහුණු එකම අයුරින් පවතී. නාසය, කට, ඇස්දෙක, කන් දෙක, මේ ආදී වශයෙනි.**

සියල්ලන්ට ම ඒවා ඇති මුත්, මුහුණු 10 ක් ගතහොත් දහ දෙනා දහ ආකාරයක් වශයෙන් වෙනස්ව හඳුනා ගැනීමට පුළුවන. එකම කුසෙහි උපදින අය අතර වුව ද ඒ වෙනස්කම් පවතී. නිවුන් සහෝදරයන්ව උපදින අය අතර වුව ද ඒ වෙනස්කම් දක්නට ලැබේ. ශාරීරික වශයෙන් වෙනස් වන සත්වයා මානසික වශයෙන් ඊටත් වඩා වෙනස්වන බව බුදු දහමේ පැහැදිලි වේ.

සියලුම සත්වයින් චරිත වශයෙන් කොටස් හයකට බෙදෙනු ඇත. රාග, ද්වේෂ, මෝහ, සද්ධා, බුද්ධි, විතක්ක වශයෙනි. එම හයෙන් එකකට හෝ කිහිපයකට සත්ත්වයා අයත් වනු ඇත. ඒ අනුව සත්වයාගේ මනෝ භාවයන් විවිධ ව, විශම ව පවතින අයුරු පැහැදිලි වේ.

සත්වයා හොඳ - නරක දෙකේ සංකලනයක් වුව ද සමහර අයට පවතින්නේ නොහොඳ පමණි. එවැනි චරිත බොහොමයක් බුදු දහම තුළ විවරණය වේ. එවැනි චරිතවල ගති ලක්ෂණ හඳුනාගෙන ඒවා තුළින් වර්තමාන සමාජයට පණිවිඩයක් දීම මෙම ලිපියෙහි අරමුණ වන්නේ ය. ඒ සඳහා හොඳම කතා පුවතක් ලෙස මට්ඨකුණ්ඩලි කතා වස්තුව පෙන්වා දීමට පුළුවන.

මට්ටකුණ්ඩලී කතා පුවත ඇතුළත් වන්නේ “බෞද්ධයාගේ අත් පොත නම් වූ ධම්ම පදයේ පළමු වග්ගය වන යමක වග්ගයේ දෙවැනි ගාථාවටයි. බුද්ධඝෝෂ හිමියන් විසින් හෙළටුවා පරිවර්තනය කරන ලදී. දඹදෙනි යුගය තුළ ලියැවෙන විශිෂ්ඨතම ධර්ම ග්‍රන්ථයක් වන සද්ධර්මරත්නාවලිය රචනා කරන්නේ ධර්මසේන හිමියන් විසිනි. එම සද්ධර්මරත්නාවලිය ලිවීමට එහිමියන් ගුරු කොට ගන්නේ පාලි ධම්මපදට්ඨ කතාවයි.

ධර්මසේන හිමියන් ධම්මපදට්ඨ කතාවේ අරුත් පමණක් ගෙන තමන්ට ආවේණික වූ සිංහල බසින් සද්ධර්ම රත්නාවලිය රචනා කළහ.

එම සද්ධර්ම රත්නාවලිය ලිවීමේ අරමුණ වශයෙන් ධර්මසේන හිමියන් පවසන්නේ,

“යම් කෙනෙක් නුවණ මදවත් කුසකච්ඡන්දය ඇතිව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දැන පින්කම්හි හැසිර නිවන් සාදා ගනිත් නම්, එසේ වූ සත්පුරුෂයන්ට වැඩ සඳහා සද්ධර්මරත්නාවලිය නම් වූ ප්‍රබන්ධයක් කරම්හ” ආදී වශයෙනි.

ඒ අනුව පැහැදිලි වන්නේ සාමාන්‍ය වැසියාට බුදු දහම අවබෝධ කරවීමටත්, ධර්මෝපදේශ ලබා දෙමින් පොදු ජනයා කුසලයෙහි හැසිරවීමටත් බවයි. සමාජයට චර්යාමය වෙනසක් ඇති කර ගැනීම උදෙසා බොහෝ ධර්ම කරුණු අන්තර්ගත වේ.

ධර්මසේන හිමියන් ප්‍රස්ථා පිරුළු උපයෝගී කොටගෙන ජන හදට ග්‍රහණය කර ගැනීමට පහසු වන අයුරින් එම දහම් පණිවිඩය නිකුත්කර තිබීම ඉතා චමත්කාරජනකය. ධම්ම පදය තුළ යුගල වශයෙන් දක්වන ගාථා අතරට මට්ඨකුණ්ඩලී කතා පුවත ඇතුළත් ගාථාව ද ඇතුළත් වේ. යුගල ගාථා තුළින් හොඳ - නරක, කුසල් - අකුසල්, පින් - පව්, සැප - දුක ආදී වශයෙන් දෙපැත්තම කීමට යොදාගෙන ඇත. ඒ අනුව මට්ඨකුණ්ඩලී කතා වස්තුව තුළින් කුසල් පැත්ත විවරණය කරනු ඇත. එම ගාථා ධර්මය නම්,

**මනෝ පුබ්බංගමා ධම්මා**
**මනෝ සෙට්ඨා මනෝමයා**
**මනසා චේ පසන්නේන**
**භාසති වා කරෝති වා**
**තතෝ නං සුඛමන්වේති**
**ඡායාව අනපායිනී**

සියලු සිතිවිලිවලට (ධර්ම) මනස (සිත) ම ප්‍රධාන වේ. ශ්‍රේෂ්ඨ වේ. එසේ ම සියලු සිතිවිලි සිතින් ම උපදී. යමෙක් ඉසි, කෝ, මද, මාන, ආදී කිළිටි සිතිවිලිවලින් තොර වූ, ප්‍රසන්න වූ (පිරිසුදු) සිතින් යම් බසක් කියයි නම් හෝ යම් දෙයක් කරයි නම් හෝ එහි ඉෂ්ට විපාක වශයෙන් ඔහු වෙත සැප සම්පත් හා සැනසීම ළඟා වන්නේ ය.

තමාගේ සෙවණැල්ල තමා අත් නොහැර, තමා සමඟ සුව සේ ගමන් ගන්නාක් මෙනි, ආලෝභ, අද්වේශ, අමෝහ යන ත්‍රිවිධ කුසල් සිතිවිලි ඇතිව යමෙක් යමක් කියයි ද, කරයි ද එහි ප්‍රතිඵලය යහපත් ය.

මෙම ගාථා ධර්මය දේශනා කිරීමට හේතුව නොහොත් නිධානය වී ඇත්තේ අදින්නපුබ්බක නම් වූ චරිතය මුල් කොටගෙන ය. අදින්න පුබ්බක යනු බුදුරදුන් කල සිටි මසුරු සිටුවරයෙකි. එම නමෙහි අර්ථය ම තණ අග තවරන ලද තෙල් බින්දුවක් තරම්වත් අනුන්ට නුදුන්විරූ ය යන්නයි.

තමන් පරිහරණය නොකිරීමත්, අනුන්ට නොදීමත් හේතුවෙන් මසුරා යන නම භාවිත වේ. එම මසුරු සිටාණෝ තම පුතුටවත් යුතුකම් නොකළ පිය කෙනෙකි. එබැවින් පුතු රෝගාතුර වී මරණ මඤ්චකයේ සිටින කල්හි බුදුරජාණන් වහන්සේ පිහිට වූ ආකාරයත්, බුදු රුව දැකීමේ පිනෙන් දිව්‍ය ලෝකයේ ඉපදීමේ භාග්‍ය ලැබූ ආකාරයත් එම කතා පුවත තුළින් විග්‍රහ වී ඇත.

අදින්න පුබ්බක සිටාණන්ගේ මනෝභාවයන් ගෙන හැර දක්වන මට්ටකුණ්ඩලී කතා වස්තුව අද ජන සමාජයට ද ඉතා වැදගත් වේ. අපේ මනස ජීවත්ව ඉද්දී ක්‍රියා කරන ආකාරයත්, ජීවිතය පුරාවට නැඟෙන චිත්ත චෛතසිකයන්ගේ ස්වභාවයත් එයට සරිලන ආකාරයෙන් මිය ගියාට පසු සිදුවන භව ගමනයත් පිළිබඳ ධර්මසේන හිමියන් මනාව ගෙන හැර දක්වා ඇත.

යමෙක් ලෝභ, ද්වේෂ, මෝහ යන අකුසල් චේතනා ඇති සිතක් ඇතිව යමක් කියයි ද? කරයිද? එය අකුසල් ක්‍රියාවක් වන්නේ ය. එය හරියට ගොනා පසුපස එන කරත්ත රෝදය මෙන් විපාක ලබා දෙනු ඇත.

ඉහත ගාථා ධර්මය සම්බන්ධ වන්නේ කුසල් පැත්ත විග්‍රහ කිරීමටයි. ප්‍රසන්න සිතින් යමක් කියයි ද? කරයිද? එය කුසල ක්‍රියාවකි.

මට්ටකුණ්ඩලී නම් වූ කුඩා දරුවා කිසිදු පින්කමක් නොකළ ද, පියාගේ පවා කිසිදු සැලකිල්ලක් නොලබා සිටිය දී වුව ද බුදුරදුන් පිළිබඳ සිත පහදවා ගැනීම පමණකින් ම මිය ගොස් දිව්‍ය ලෝකයේ ඉපදීමට හේතු විය. මෙතන දී පියාගේ මනෝභාවයන් හා පුතාගේ මනෝභාවයන් දෙඅංශයකින් ක්‍රියා කළ ආකාරය පිළිබඳ විවරණය කිරීමට ධර්මසේන හිමියන් සමත් වී ඇත.



අප ජීවත් වීමේ දී අධික ලෙස ධන සම්පත් සොයා ඒවා පරිහරණයත් නොකොට, දනට පිනට දීමකුත් නොකොට දැඩි තෘෂ්ණාවෙන් මිය ගොස් එම ධන සම්පත්වලට ම ඇලුම් බැලුම් දක්වන පෙරේතයන්, භූතයන් වී ඉපදෙනු ඇත. මෙය වටහා ගැනීමට හොඳ ඥාණ ශක්තියක් තිබිය යුතු ය.

අපේ මනස ඉතා බලවත් ය. සංසාර ගමන ම ඒ ඔස්සේ ක්‍රියාත්මක වේ. එබැවින් මනස විකෘති කර ගැනීම හෝ ප්‍රසන්න කර ගැනීම තම තමා විසින් ම සිදු වන්නකි. උසස් මනසක් ලැබූ සත්ත්වයා නිරන්තරයෙන් ම සිදු කර ගත යුත්තේ මනස ප්‍රසන්න කර ගැනීමයි.

ධන සම්පත් තුළින් පොහොසතෙක් නොවුණත් ප්‍රසන්න සිතිවිලිවලින් පොහොසතෙක් වීමට පුළුවන. එය තම මනස ධනාත්මක තැනට වර්ධනය කොට ගෙන ආධ්‍යාත්මික පැත්තෙන් පොහොසත් වීමයි. අවසන් ගමන් යෑමේ දී සියලු ධන සම්පත් අත්හැර යෑමට සිදුවනු ඇත.

තමන්ට යහපත් අයුරින් ගෙන යෑම සඳහා ඇත්තේ එම ප්‍රසන්න සිතින් එක් රැස් කර ගත් ආධ්‍යාත්මික ගුණ වගාව පමණි. බුදුරජාණන් වහන්සේ සප්තාර්ය ධනය තුළින් දේශනා කොට ඇත්තේ ද එයයි.

සද්ධා, ශීල, හිරි - ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා යන ධන හත යමකුට වර්ධනය කර ගැනීමට හැකි නම් ඔහු කිසිදා දුප්පතෙක් ලෙස සැලකීමට නොහැක. ඔහු සසර ගමනට අවශ්‍ය ධනය සම්පාදනය කර ගත් පොහොසතෙකි.

තුනුරුවන් පිළිබඳ මනා අවබෝධයකින් ඒ හරහා අපගේ සිත් ප්‍රසන්න කර ගැනීම සිදු කළ යුතුව ඇත. මට්ඨකුණ්ඩලී තම සිත පහදවාගෙන දිව්‍ය ලෝකයේ ගමන් කළේ මහ ලොකු පින්කම් කරගෙන නොවේ. ඒ මානසික ශක්ති චුති චිත්තය හා සම්බන්ධ කර ගැනීම ඉතා වැදගත් වේ.

විවිධ, විශම, පුද්ගල සමාජයක ජීවත් වන්නවුන් වශයෙන් අදම අද ම මානසික සංවර්ධනය කර ගත යුතුව ඇත. තරගකාරී ලෝකයක උමතු විලාසයෙන් දිවීම නිෂ්ඵල ක්‍රියාවකි. එය සසරට යහපත ගෙන දෙන්නක් නොවේ.

සසර ජය ගැනීමට නම් තම තමන්ගේ මනෝභාවයන් දැන හඳුනාගෙන සසර අගාධයට ඇද දමන්නා වූ ලෝභ, ද්වේශ, මෝහ ආදී අකුසල් මැඩ පවත්වාගෙන අලෝභ, අද්වේශ, අමෝහා දී කුසල් සිත් වර්ධනය කර ගත යුතු ය.

ඕනෑම කෙනකුට මානසික වර්ධනයක් ඇති කර ගැනීමටත්, පරලොව ජය ගැනීමටත් වටිනා කතා පුවතක් ලෙස මට්ඨකුණ්ඩලී කතා වස්තුව හඳුන්වා දීමට පුළුවන. ඕනෑම කෙනකුගේ ජීවිතයේ අඩු පාඩු සකස් කර ගැනීමටත්, තුනුරුවන් මුල්කොටගෙන සසර ජය ගැනීමටත් පුළුවන් ආකාරය ඉතා මැනවින් එම කතා පුවත තුළින් විග්‍රහ කර ඇත. එසේ නම් අප සෑම දෙනෙක් ම එම කතා පුවත පිළිබඳ අවධානය යොමු කොට අපේ ජීවිතය ද සාදා ගැනීමට උත්සාහවත් වෙමු.

මහව, උඩගම ශ්‍රී ඉන්ද්‍රසුමන මහ පිරිවෙන්හි ප්‍රවීණාචාර්ය , ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛන ශාස්ත්‍රී
**ගලගෙදර රතනවංස හිමි**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

ඇසළ පුර අටවක 2022-07-07

## සතුරා හඳුනාගැනීම

මෛත්‍රිය යනු හිතමිතුරු බව ය. කෙනකුට තමන් ඇතුළු සියලු ලෝ සතුනට අවංක සිතින් මෙත් වඩන්නට හැකි නම් සතුරන් දුරුවී සියලු ලෝ සතුන් මිතුරු බවට පත්වනු ඇත. එහෙත් බොහෝ දෙනෙක් දිවි ගෙවන්නේ විවිධ වෙස්ගත් බාහිර සතුරන්ගෙන් තමන්ට කවර මොහොතක හෝ විපතක්, කරදරයක් වේ යැයි සංකා සිතිනි. තැතිගත් බිවිනි. තමන්ට වැරැදී ඇත්තේ ද ඒ සිතිවිල්ල තුළ ම බව දන්නේ ශ්‍රී සද්ධර්මය පිළිබඳ දැනුම්වත් වූ තැනැත්තා ම ය. එනම්, ඒ සියලු බාහිර සතුරන්ට වඩා භයානක සතුරා සිටින්නේ තමන් සමීපයේ ම බව ය. ඒ අන් කවරකු හෝ නොව වැරැදි මඟ ගමන් කරවන තමන්ගේ ම සිතය. බාහිරින් පැමිණෙන සතුරු කරදර, විපත් ඒ සිදුවීමෙන් අවසන් වෙයි. එහෙත් සිත වරදෙහි බැඳුණේ නම්, අයහපතෙහි යෙදවූයේ නම් එයින් වන විපාක තමන් වෙත ම ලුහුබඳිමින් පැමිණේ. අවසානයක් නොවේ. එය මේ බවයෙන් නො නැවතී සසර පුරා ම අප පසුපස පැමිණිය හැකි ය.

ජීවිතයේ මුහුණ දෙන සමාජ ආර්ථික ප්‍රශ්න ඇතුළු බොහෝ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමේ දී සිත වැරැදි මඟ ගමන් කිරීමට ඇති ඉඩ වැඩි ය. ජීවත්වීම සඳහා ඕනෑම අයහපතක්, වැරැදි මාර්ගයක් තෝරා ගන්නට ඇති ඉඩ වැඩි ය. ඇතැම් කෙනෙක් එවන් ගැටලුකාරි තත්ත්වයක් නොවුණ ද ලෝභ, ද්වේෂ, මෝහා දී අකුසල සිතිවිලි නිසා සිත මෙහෙයවා බොහෝ පව් රැස් කර ගන්නා අවස්ථා ද විරල නැත. කවර තත්ත්වයක් හමුවේ වුව ද සිත සතුරු වූයේ නම් තමන්ට එයින් ගැලවීමක් නැත.

සුමනා කුමරිය සිටුතුමාගේ බාලම දියණිය යි. ඇය ඉතා සැදැහැවත් ය. දැහැමින්, යහපත් සිතිවිල්ලෙන් ම ජීවත් වූවා ය.

ඇය ධර්මය අසා සකෘදාගාමී ඵලයට ද පැමිණියා ය. එහෙත් ඕ තොමෝ ටික කලෙකින් බලගතු ලෙස රෝගාතුර විය. ආහාර පවා ගැනීමට නොහැකි විය. මරණ මොහොත ළඟා වූ බව දැනුණු ඇය තම පියාණන් දකිනු කැමැති විය. සිටුතුමා එහි ගොස් තම දියණියගෙන් සුවදුක් විමසීය. තමන් කැඳවූයේ කුමටදැයි ඇසුවේ ය.

එවිට සුමනා කුමරිය බාල සහෝදරය, මේ ඔබ කුමක් කියන්නේ දැයි ඇසුවා ය. එවිට පියාණන් ඇසුවේ දියණිය නන්දොඩවන්නේ කුමක් නිසා ද යනුවෙනි. එවිට ඇය “බාල සහෝදරය, මා නන්දොඩවන්නේ නැතැ’යි කීවා ය. “එසේ නම් මගේ දියණිය බියට පත් වී “දැයි සිටුතුමා ඇසුවේ ය.

“බාල සහෝදරය, බිය වන්නේ කුමටද?” ඇය පිළිතුරු දුන්නා ය. සිටුතුමා තම දියණිය ගේ වදන් අසා බොහෝ දුකට පැමිණුනි. එයින් මද වේලාවකින් ඇය කළුරිය කළා ය.

සිටුතුමා සෝවාන් වී සිටිය ද තම දියණියගේ හදිසි වියෝව දරා ගන්නට නොහැකි විය.අවසන් කටයුතු නිමවා බුදුරජාණන් වහන්සේ හමුවට ගොස් හඬා වැළපුණේ ය. මරණ මොහොතේ දියණියගේ හැසිරීම ගැන පවසමින් තමන් හඬන්නේ, මරණය ගැන නොවන බවත්, පවට ලජ්ජා බිය ඇතිව ජීවත්වූ තමන්ගේ දියණියට මිය යන මොහොතේ සිහි එළවා ගත නොහැකිව තමන්ට බාල සහෝදරයා ලෙස තෙවරක් ම කීම නිසා බවත් පැවසුවේ ය.

එවිට බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ ඇය මඟඵල ලැබීමෙන් සිටුවරයාට වඩා වැඩිමහල් නිසා එසේ පැවසූ බවත්, මියගොස් තුසිත දෙව්ලොව උපන් බවත් ය. සුමනා කුමරියගේ මිතුරු සිත ඇය අපායෙන් මුදවා ගත්තේ ය. එහෙයින් කවර තත්ත්වයක් හමුවේ වුව ජීවත්ව සිටින තාක් පිරිසුදු සිතින්, පින් දහම්හි අප්‍රමාදී විය යුතු ය. පවට ලජ්ජා, බිය ඇතිකර ගත යුතු ය. පුරුදු පුහුණු කරන ලද යහපත් සිතම පින් කෙතකි. එහි මිත්‍රශීලි අස්වනු අනුන්ට නොව තමන්ට ම ය.

# ආමගන්ධය පිළිබඳ සැබෑ බුද්ධ වචනය



කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව
පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

**තථාගත දේශනාවට අනුව ආමගන්ධය යනු පිළීගඳයි. සම්බුද්ධ දේශනාව තුළ පිළීගඳ පිළිකුල් කර ඇත. සු.නි. පාතයේ ආමගන්ධ සූත්‍රය ඒ පිළිබඳ ඉතා පැහැදිලි විවරණයන් සිදුකර ඇත.**

වර්තමානයේ දී මේ පිළීගඳ පිළිබඳ විවිධ නිර්වචන ආගමේ නාමයෙන් බොහෝ දෙනා ඉදිරිපත් කරමින් පවතී. මේ නිසා නියම බුද්ධ වචනය පිළිබඳ සැක සංකා මතුවී ඇත. ගිහි පැවිදි පිරිස් වශයෙන් එය නිරාකරණය කර ගත යුතු වේ. මෙහිදී පැනනඟින මූලිකම තර්කය වනුයේ මස් මාංශ අනුභවය පාපයක් ද යන්නයි. එය ගොඩනැඟී ඇත්තේ මූලික කාරණා කිහිපයක් නිසාවෙනි.

මස් මාංශ අනුභවය නිසා ප්‍රාණඝාත අකුසලය සිදුවීම හෝ එයට අනුබලදීම.

ශාක, ධාන්‍ය ආහාරයට ගැනීම නිසා සිල්වත්කමක් ඇතිවේ ය යන විශ්වාසය.

බුදු පසේ බුදු මහරහත් යන උත්තමයන් මස් මාංස අනුභව කළේ ද යන්නයි.

සම්බුද්ධ දේශනාවට අනුව ප්‍රාණඝාතයක් සිදුවීමට බලපාන කාරණා 05 ක් සහ ප්‍රාණඝාතයේ ප්‍රයෝග 05 ක් සඳහන් කරයි. ප්‍රාණඝාත අකුසලය සිදුවන්නේ මෙම කරුණු සම්පූර්ණවීමේ දී පමණි.

පණ ඇති සතකුවීම, පණ ඇති සතකු බව දැනීම, මරන්නට කැමැති සිත, උපාය සැකසීම, ඒ උපක්‍රමය නිසා මිය යාම යන කරුණු සම්පූර්ණ විය යුතු ය.

ගමන් බිමන්වල දී සතුන් පයට පෑගී මියයෑම හෝ අම්මාගෙන් දරුවකුට හානි වේ යැයි සිතා මදුරුවකු මැරීම දරුවාට පව් සිදුවීමට හේතු නොවේ. එය මවට පවකි.

මැරීමට ප්‍රයෝග ලෙස ගැසීම, කැපීම අනකකු ලවා කරවීම, ආයුධ දමා ගැසීම, උගුල් ඇටවීම, සූනියම්, වස්කවි, අමනුෂ්‍ය ක්‍රියා මෙයින් ඉවත්වන්නට සමත් ද එය ප්‍රාණඝාතය නොවේ. එසේම මෛත්‍රිය තිබිය යුත්තේ පුද්ගල සිතේ මිස මළකුණුවල නොවේ.

දලු, පලා කොළ පලතුරු, ධාන්‍ය ගත්තද එයත් මේ හා සමාන ය. පුද්ගල හිත තුළ මෛත්‍රිය කරුණාව පවත්වානොගෙන උම්බලකඩ, කරවල, හාල්මැස්සන් පිළිබඳ මෛත්‍රිය අර්ථවත් නොවේ.

තථාගත දේශනාවට අනුව නිවනට බාධා වන්නේ රස තෘෂ්ණාවයි. රස තෘෂ්ණාවෙන් යුක්තව අල බතල, පරිප්පු කෑවත් වෙනයම් මාංසයක් අනුභව කළත් දෙකම එක හා සමාන වේ. විය යුත්තේ රස තෘෂ්ණාව නැති කිරීම ය.

රහතන් වහන්සේට එවැනි තෘෂ්ණාවක් ඇත්තේ නැත. මළකුණු අනුභව නොකළත් වෛරය, ද්වේෂය වැනි දෑ ඇත්නම් එය පිළීගඳකි. නිගණ්ඨනාථ පුත්ත පරම අවිහිංසාවාදියෙකි. එහෙත් තථාගතයන් වහන්සේ පිළිබඳ මහත් වෛරයෙන් කටයුතු කළහ.

වර්තමානයේ දී පවා ඇතැම් නිර්මාංශ වූවන් දෙව්දත් තෙරුන් මෙන් අපාගත වීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම දැකිය හැකි ය. මහා සීහානාද සූත්‍රයේ දී සැරියුත් හිමියන් අමතන බුදුරදුන් දේශනා කරන්නේ තමන් වහන්සේ දුෂ්කර ක්‍රියා කළ කාලයේ දී එකම අධිගමයක්වත් නොලැබූ බව ය. එයින් පැහැදිලි වන්නේ ආහාරය නිසා නිවන් මඟ වේගවත් නොවූ බවයි. මේ ලිපියේ අරමුණ මස් මාංශ අනුභවය හෝ එපාය යන්න සඳහන් කිරීම නොවේ.

තථාගත දේශනාව අනුව සැබෑ පිළීගඳ කුමක්ද යන්න පැහැදිලි කිරීමයි. ආමගන්ධ බමුණා බුදුරදුන්ගෙන් විමසූ පැනයට කාශ්‍යප බුදුරදුන් තිස්ස බමුණාට පැහැදිලි කළ ධර්ම කාරණය ගෞතම බුදුරදුන් විසින් ආමගන්ධ බමුණාට දේශනා කිරීමයි.

ආමගන්ධ බමුණා සඳහන් කරන්නේ, අල, මුල්, ගස්වල ගෙඩි, පලතුරු අනුභව කරන අය වඩාත් සිල්වත් බව ය. එමෙන්ම ඔබ වහන්සේ සඳහන් කරන ආමගන්ධය මොනවාද? එහෙත් කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ඇල් සහල් සහ ළිහිණි මස් වැළඳුවා නේද යනුවෙන් චෝදනා සිදුකරනු ලැබීය.

තථාගතයන් වහන්සේ ඊට පිළිතුරු ලෙස දේශනා කළේ ත්‍රිකෝටික පාරිශුද්ධ මාංශය කැප බවයි. එනම් තමන් ප්‍රාණඝාත නොකිරීම, අනුබල නොදීම, නොකරවීම යනු කරුණු තුනෙන් යුක්ත ආහාරයයි. එහිදී තථාගතයන් වහන්සේ සැබෑ පිළීගඳ ඉතා දීර්ඝව විස්තර කරන්නට යෙදුණි.

වර්තමානයේ දී මේ පිළිබඳ සබුද්ධිකව සිතීම ඉතා අවශ්‍යය. තථාගත දේශනාවට අනුව ආමගන්ධය හෙවත් සැබෑ පිළීගඳ මෙසේ පෙළගැස්විය හැකි ය.

ප්‍රාණඝාතය, තැලීම, කැපීම, සොරකම, බොරුව, රැවටීම අවැඩට හේතුවන පොත පත කියවීම, අනුන්ට අයත් අඹුවන් කරා යාම, ආශා කිරීම, කාමයෙහි අසංවර බව, රසයෙහි ගිජුවීම, මිථ්‍යාදෘෂ්ටි ඇතිබව, මිත්‍ර ද්‍රෝහී වීම, මානය, අධික මානය ඇති බව, නොදෙන සුළු වීම, ක්‍රෝධය, ජාතිමදය ආදී මත්වීම, මායාව, පසමිතුරුකම, ඊර්ෂ්‍යාව, තමා උසස් කොට දැක්වීම, අසත්පුරුෂයන් හා මිත්‍රත්වය පැවැත්වීම, ලාමක ආචාර ඇතිබව, ණය නොගෙවන බව, කේළාම් කියන බව, අල්ලස් ගෙන නඩු අවනඩු කිරීම, අධර්මයෙහි කටයුතු කරමින් ධර්මයෙහි හැසිරෙන බව දැක්වීම, දුරචාරය, රෞද්‍ර වචන ඇති බව, ආදරය නැති බව, ප්‍රාණීන් පිළිබඳ තෘෂ්ණාවෙන් යුක්තවීම, මෙම කරුණු පිළීගඳ හෙවත් ආමගන්ධ යයි.

එසේ නොමැතිව මස් මාංශ ආමගන්ධය නොවේ. මෙම දුර්ගුණ එකක් හෝ තම ජීවිත තුළ පවත්නේ ද සූත්‍රයට අනුව ඔවුනට අවීචියට යාමට සිදුවේ. තවදුරටත් මෙහි දක්වනුයේ දුරු නොවූ සැකය ඇති පුද්ගලයා මස් මාංශ නොකෑ පමණින් පිරිසුදු නොවේ.

ඇතැමෙක් ඉහත දැක් වූ සියලු අඩුපාඩුකම් සහිතව වාසය කරන ගමන් එය සාධාරණීකරණය කර ගැනීමට සඳහන් කරන එකම කාරණය වන්නේ ද නිර්මාංශ වීමයි.

ඇතැමෙක් බොහොම උජාරුවෙන් සඳහන් කරනුයේ හාල්මැස්සෙක්, උම්බලකඩ කෑල්ලක්වත් අනුභව නොකරන තමන්ට මෙවැනි දේ කිරීම සුදුසු නොවන බවයි. ඔවුන් කල්පනා කරන්නේ අනෙක් සියලු දුරාචාරයන්ට වඩා මස් මාංශ අනුභවය පාපයක් බවයි. හිට්ලර් සහ දෙව්දත් හිමියන් ද කල්පනා කළේ එසේම ය.

පුද්ගලයා හා සමාජයට ඇවැඩ පිණිස පවතින පිළීගඳ පිළිබඳ අමුතුවෙන් විස්තර කළ යුතු නොවේ. වර්තමානයෙහි ඇති වී ඇති අර්බුද දිහා බලනවිට එය මනාව පැහැදිලි ය. මේ ප්‍රශ්න ගොඩනැඟුණේ කරවල, හාල්මැස්සන්, උම්බලකඩ කෑම මත නොවේ.

තථාගත දේශනාවට අනුව සැබෑ පිළීගඳ වූ සොරකම, බොරුව, මිථ්‍යාදෘෂ්ටිය, ක්‍රෝධය, මානය, මායාව ණය නොගෙවන බව සහ ගත් ණය නියමිත පරිදි නොයෙදවීමයි. මේ තුළින් කෙතරම් ප්‍රාණඝාත, තැලීම් කැපීම්, රැවටීම් සිදු වූයේ ද යන්න පුන පුනා සඳහන් කළ යුතු නොවේ.

පුද්ගලයා වෙන්විය යුත්තේ පාපය ඇතිවන පිළීගඳින් ය. දහමෙහි අරමුණ වන්නේ “සබ්බේ සත්ථා සවන්තු සුඛිතත්තා” යන්නයි. සියලු සත්වයෝ සැප කැමැත්තෝ වෙත්වා මේ අරමුණ සාධනය වීමට මේ පිළීගඳ ඇතිවන ක්‍රියාවන් සහ සිතුම් පැතුම්වලින් ඉවත්විය යුතු වේ. ඒ තුළ දොලොව සුගතිය සකසාගත හැකි ය.

# නිදහස් චින්තනයෙන් සැබෑ වෙනසකට පූර්විකාවක්...

**වර්තමානයේ බොහෝ දෙනා නිදහස ඉල්ලා අරගල කරති. වහල්භාවය පිටු දකිති. ක්‍රමවේද වෙනසක් අපේක්ෂා කරති.(A change in the system) එදා මිහිඳු මහ රහතන් වහන්සේ , ධර්ම රාජයාණන් වහන්සේගේ උදාර දහම රැගෙන ආ දින අපි නිදහස් ජාතියක් වූ බව වර්තමාන පුරවැසියෝ නොදනිති. එදා ක්‍රමවේද වෙනසක් වූ බව නොදනිති. ඊට හේතුව මහා මහින්ද මහ රහතන් වහන්සේ අපට ලබා දුන් පණිවුඩයෙහි අල්ප මාත්‍රයකුදු අප නොදන්නා නිසාවෙනි. යළිත් ඒ මිහිඳු යුගය අරඹන්නට පූර්විකාවක් උදෙසා මෙම ලිපිය ලියන්නට අදහස් කළෙමි.**

**ධර්මාශෝක අධිරාජයාණන්ගේ ධර්ම ප්‍රචාරක ක්‍රියාදාමයෙහි ප්‍රතිඵලයක් ලෙස ලොව්තුරු ශාන්තිනායක අමා මෑණි බුදු පියාණන් වහන්සේගේ උතුම් ශ්‍රී සද්ධර්මය රැගෙන මහා මහින්ද මහරහතන් වහන්සේ සිරිලකට වැඩම කළහ.**

ලාංකිකයෝ උන්වහන්සේ අනු බුදුවරයකු සේ වන්දනා මාන කරති. මහා මහින්ද මහරහතන් වහන්සේ මිස්සක පව්ව පිහිටි මහ වනයෙහි දී ලාංකිය ප්‍රමුඛ පුරවැසියා දේවානම් පියතිස්ස මහ රජතුමා මුණ ගැසිණි. බුද්ධි පරීක්ෂණයක් තුළින් රජ නැණවතකු බව වටහා ගත් උන්වහන්සේ චුල්ල හත්ථිපදෝපම සූත්‍රය රජුට දේශනා කළ සේක.

ජාණුස්සෝණි බ්‍රාහ්මණයා හා පිලෝතික පරිබ්‍රාජකයා යහළුවන් දෙදෙනෙකි. හමු වූ අවස්ථාවක දි පිළිසඳර කථා කරන විට පිලෝතික පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේ මුණ ගැසී උන්වහන්සේගේ ශ්‍රාවකයකු වූ බව දක්වයි. බුදුරජාණන් වහන්සේ යනු මහා ප්‍රඥාවන්තයකු වන බවට තිබෙන සාක්ෂි කවරේදැයි ජාණුස්සෝණි විමසයි. එවිට පිලෝතික පරිබ්‍රාජක කියනුයේ බුදුරජාණන් වහන්සේ “සම්මා සම්බුද්ධ ” වන බවත් උන්වහන්සේ ගේ ශ්‍රී සද්ධර්ම “ ස්වාක්ඛාත” වන අතර උන්වහන්සේගේ ශ්‍රාවක සංඝයා “ සුපටිපන්න” වනබවත් ඇත් පාදයක් දැක ඇතකු හඳුනා ගන්නාක් මෙන් උන්වහන්සේ හඳුනා ගත හැකි ඤාණ පාද හතරක් වන බව දක්වයි. මහා නැණවත් බ්‍රාහ්මණ පණ්ඩිතයෙක්, ක්ෂත්‍රීය පණ්ඩිතයෙක්, ගෘහපති පණ්ඩිතයෙක්, ශ්‍රමණ බ්‍රාහ්මණයෙක් උන්වහන්සේ ගම් නියම්ගම්වලට එන බව අසා උන්වහන්සේ හා වාද කිරීමට කරුණු, ගැටලු රාශියක් එකතු කර ගනී. දින සති මාස අවුරුදු ගණන් එකතු කළ එම ගැටුම් පොදිය ගෙන උන්වහන්සේ හා වාද කරන බවට වහසි බස් කියමින් උන්වහන්සේ හමුවීමට යයි. එසේ ගොස් පිළිසඳර කථාවක යෙදී උන්වහන්සේගේ ධර්ම කථාවට සවන් දෙයි. අනතුරුව යළි වාද කිරීමකින් තොරව උන්වහන්සේගේ ශ්‍රාවකයකු වෙයි. මේ කරුණ පදනම් කොටගෙන තමා එසේ කියන බව දක්වයි.

ජාණුස්සෝණි බ්‍රාහ්මණයා ද එහිදීම බුදුරජාණන් වහන්සේ සිටින දිසාවට වන්දනා කොට බුදුරජාණන් වහන්සේ හමුවීමට යයි. ජාණුස්සෝණි බ්‍රාහ්මණයා බුදු රජාණන් වහන්සේ හමු වී පිළිසදර කථා කොට ධර්ම කථාවට සවන් දී තමා මෙසේ පැමිණියේ පිලෝතික පරිබ්‍රාජක නිසා බවත්, ඔහු බුදුරජාණන් වහන්සේ හඳුන්වා දීමට කළ ඇත් පාදයෙහි උපමාව ද දක්වන ලදී. ඇත් පාදය පිළිබඳ එහි ඇත්තේ කෙටියෙන් බවත්, ඇත් පාදය පිළිබද පූර්ණ විස්තරයක් තමන් වහන්සේ දේශනා කරන බවත්, එයට සවන් දෙන ලෙසත් දන්වා බුදුරජාණන් වහන්සේ මේ චුල්ලහත්ථි පදෝපම සූත්‍රය දේශනා කළහ.

ඇතුන් අල්වන අයෙක් ඇතුන් ඇල්වීම සඳහා මහ වනාන්තරයකට පිවිසෙයි. ඔහු විශාල ඇත්පාද තිබෙන තැන් වනයෙහි දකියි. එතැන මහ ඇතා ඇතැයි සිතා එහි මදු ගසා බලා සිටියි. එසේ වුවත් ඒ මහ ඇතා වසන තැන නොවෙයි.එසේ මහ ඇත්පාදයක් ඇති වාමනිකා නම් ඇතින්නියන් වර්ගයක් වනයෙහි වෙසෙයි. අනතුරුව ඔහු වනය මැදට ගොස් ගස්වල උස් තන්හි පිට ඇතුල්ලූ තැන් දැක එතැන මහ ඇතා ඇතැයි සිතයි. එහෙත් කැළෑවෙහි උච්චා කණේරුකා යැයි උස ඇතින්නියන් විශේෂයක් වෙයි. අනතුරුව ඔහු විශාල ඇත්පාද ඇති උස තැන්හි පිට ඇතිල්ලූ, උස තැන්වලින් අතු කොළ කඩා ගත් ස්ථාන දකියි. එතැන මහ ඇතා ඇතැයි සිතයි. එහෙත් වනයෙහි උච්චාකාලාරිකා නම් ඇතින්නියන් විශේෂයක් වෙයි. එසේනම් ඇත් පාදය හෝ ඇතුන් පිට ඇතුල්ලූ තැන් හෝ ඇතුන් අතු කොළ කඩා කෑ තැන් ගැන සලකා හෝ මහ ඇතා එතැන ඇතැයි අනුමාන කළ නොහැක. මහ ඇතා දුටුව විට මේ මහ ඇතා යැයි සනිටුහන් කිරීම ඇතා හඳුනාගත හැකි නිවැරැදිම ක්‍රමවේදය වෙයි. මේ ලෝකයේ යමක් හඳුනාගත හැකි ඥාන ශක්තීන් දෙකක් වෙයි.

එනම් අනුමාන ඥානය හා ප්‍රත්‍යක්ෂ ඥානයයි. අනුමාන ඥානය යනු බාහිර යම් යම් දේ දෙස බලා අනුමාන කිරීමයි. අනුමාන කිරීම සත්‍ය නොවෙයි. අනුමාන කොට ගන්නා තීන්දු තීරණ වැරැදි තීන්දු තීරණ වෙයි. ලෝකයේ බොහෝ දෙනකුට ඇත්තේ අනුමාන ඥානයයි. ලෞකික විද්‍යාවන් තුළින් අප ලබන ඥානය සත්‍යෝ නොවෙයි. අනුමාන ඥානයකි. අනුමාන ඥානය විටින් විට වෙනස් වෙයි. එමෙන් ම අනුමාන ඥානය තමන්ගේ ම ඥානයක් නොවෙයි. එය අපට ලබා දෙන්නේ බාහිර ලක්ෂණ තුළින් ය. එය පැහැදිලිව ම මුළාවකි. රැවටිල්ලකි. ඒ නිසා ම එම ඥානය වහල් ඥානයකි. තවකකු කී, තව සංකේතයකින් පළ කළ අදහසකි. එය එසේම අප වැළඳ ගැනීමකි. දේශපාලන, ආර්ථික, අධ්‍යාපන , ආගමික හා සමාජ සංස්කෘතික විවිධ ක්ෂේත්‍රවල දී පවතින්නේ මෙම අනුමාන ඥානයයි. මේ නිසා බොහෝ රැවටීමට ලක් වෙයි.

ඡද්දන්ත ජාතකයේ දී හස්ථිරාජයා මැරීම සදහා ඝාතකයා යන්නේ ගුරු පාට ඇඳුමක් හැඳ තාපසයකුගේ ස්වරූපයෙනි. ඒ තාපසයකුගෙන් කිසිවකුට හානියක් නොවේ යයි අනුමානයයි. අප වුව ද මෙසේ රැවටෙයි. හොඳින් හිස රැවුල් බා, සිවුරු හැඳ පෙරවා, සෙමින් ගමන් කරන, වංචනිකයන් දකින අප ඔවුන් රහතුන් යැයි පසේ බුදුවරුන් ය. බුදුවරුන් ය යනුවෙන් අනුමාන කරයි. සුදු ඇඳුම් අඳින හැමෝම අවංක නැත. වංචනිකයෝ වෙසෙති. කෙනකුගේ රවුල, කොණ්ඩය, ඇඳුම පැළඳුම දෙස බලා ඔහු ගැන තීන්දු ගැනීම අනුමාන ඥානයයි. නමුත් එය සත්‍ය නොවෙයි.

ප්‍රත්‍යක්ෂ ඥානය යනු පිරිසිඳ ඥානයයි. එය යමක් බාහිරෙන් දැක ලබන අනුමාන ඥානයක් නොවෙයි. එය සත්‍ය වශයෙන් දකින ඥානයකි. ඒ සඳහා ඒ තුළට අප ප්‍රවේශ විය යුතුයි.


බුදුරජාණන් වහන්සේ දකින්නට නම් බුදු ගුණ හඳුනාගෙන ඒ ගුණ ජීවිතයට ඇතුලු කර ගත යුතුයි. රහසින්වත් පව් නොකිරීම, සම්මා සම්බුද්ධ ගුණය, අෂ්ට විද්‍යාවන් හා පසළොස් ආචාර ධර්ම අනුගමය, යහපත් ගමන් මාර්ගය වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය, දමනය කළ නොහැකි පුද්ගලයින් නිරායුදව මෛත්‍රී, කරුණා ගුණයෙන් දමනය කිරීම, දෙව් මිනිසුන්ට ගුරු වීම, බුද්ධ ඤාණය ලැබීම හා භාග්‍යවන්ත වීම. මෙම බුද්ධ ගුණ අප තුළ වේ නම් අප බුදුරජාණන් වහන්සේ දකියි. ධර්මය දකින්නට මුල, මැද, අග යහපත්ව දෙසූ ධර්මය අපේ ජීවන ප්‍රතිපදාවට ලබා ගත යුතුයි.

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයකු වන්නට නම්, උන්වහන්සේ තම ශ්‍රාවකයන්ට කළ යුතුනොකළ යුතු යැයි කියු දේ කිරීම, නොකිරීම සිදු කළ යුතුයි.

සමාජය වෙනස් කිරීමට පෙර තමා වෙනස් විය යුතුයි. ඒ වෙනස සැබෑ වෙනසක් (real difference) වීමට නම් ප්‍රත්‍යක්ෂ ඥානය තිබිය යුතුයි. මිහිඳු මහරහතන් වහන්සේ ගේ මෙම ප්‍රත්‍යක්ෂ ඥානය පිළිබද දැක්ම තුළින් ලාංකීය සමාජයේ ක්‍රමවේදයේ වෙනසක් ඇතිවිණි. පන්සිල් සුරකින පරමාදර්ශී සමාජයක් බිහිවිණි.

ආත්ම පරිත්‍යාගයෙන් මිනිස්සු සීලය ආරක්ෂා කළහ. රජු ධාර්මික විය. ඔහු බෝසත්වරයකු ලෙස සැලිකීය. ආර්ථිකය ධාර්මික විය. අධ්‍යාපනය සීල, සමාධි , ප්‍රඥා ගොඩනඟන අධ්‍යාපනයක් විය. සමාජ සංස්කෘතිය ද ධර්මානුකූල විය. යහපත් සමෘද්ධියකින් යුත් සමාජයක් බිහිවිණි. වැවයි දාගැබයි - ගමයි පන්සලයි යන තේමාව යටතේ වූ සභ්‍යත්වයක් බිහිවිණි. වැව ආර්ථික සංවර්ධනයේ සංකේතය වූ අතර, දාගැබ ආධ්‍යාත්මික සංවර්ධනයේ සංකේතය විය. ගමේ නායකත්වය පන්සලයි. පන්සල තුළින් පරිපූර්ණ පුද්ගල සංවර්ධනය ගොඩනැඟිණි. ප්‍රත්‍යක්ෂ ඥානය තුළින් එවන් සුබිත මුදිත රටක් ගොඩ නඟන්නට පෙරමුණ ගනිමු.





ඌවේ සියම් මහා නිකායේ මහා ලේඛකාධිකාරි,වැලිමඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**විල්ඔය පඤ්ඤදතිලක හිමි**

# ඉපදෙන මියයන ඉරණමට හසුනොවී මරණය පරාජය කරන හැටි





පොල්ගහවෙල මහමෙව්නා භාවනා අසපු සංචිතයේ නිර්මාතෘ සහ අනුශාසක
**කිරිබත්ගොඩ ඥාණානන්ද හිමි**

**මරණය පරාජයට පත්කිරීම ලෙහෙසි නැත. යමෙක් මරණය පරාජය කොට දිනුම ලබන්නේ නම්, ඔහු ලොව දිනූ පුද්ගලයා ය. ඔහුගේ දිනුම ස්ථිරසාර, නොවෙනස්, අනභිභවනීය දිනුමෙකි.**

ඉපදෙන මැරෙන මේ ලෝකයෙහි එසේ මරණය දිනූ කෙනෙක් සිටියහ. ඒ ලොව දිනූ භාග්‍යවතුන් වහන්සේ ය. උන්වහන්සේ මරණය දිනූ සේක.

අවිද්‍යාව නමැති මහා අඳුරෙන් සියල්ල වසාලයි. තණ්හාව නමැති මහා බන්ධනයෙන් ආශා කළ දෙයෙහි පැටලී වෙළී යයි. එවිට ඔහුගේ දිවිය අවිද්‍යාවෙන් වැසී ඇත්තේ ය. තණ්හාවෙන් බැඳී ඇත්තේ ය. කර්මයෙන් සිර වී ඇත්තේ ය. එවැන්නකුට යළි යළි උපතත්, මරණයත් හැර අන් කුමක් ලබන්නට ද.

භාග්‍යවතුන් වහන්සේ ඒ අවිඳු අඳුර නසා ආලෝකය උපදවා ගන්නටත්, තණ්හාවේ අදිසි යදම් සිඳ බිඳ එයින් නිදහස් වෙන්ටත්, කර්මයේ සියලු බලපුළුවන්කාරකම් බිඳ දමන්ටත් සමත් වූ සේක.

ඒ සියල්ල කර ගනු ලැබුවේ තමන් වහන්සේ විසින් ම විමසා බලා සොයා ගන්නා ලද අංග අටකින් යුතු ශ්‍රේෂ්ඨ ප්‍රතිපදාව නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය මනාව ප්‍රගුණ කර ගැනීම නිසා ය.

භාග්‍යවතුන් වහන්සේ එතැනින් නොනැවතුණු සේක. උපත හා මරණයට පටලැවී, සිරවී අනේක ආත්මයන්හි රඳවමින්, අනන්ත දුක් කම්කටොලු ලැබ දෙන මේ ජීවිත රටාවෙන් නිදහස් වීමේ අද්භූත අත්දැකීම ලෝ සත ඉදිරියේ හෙළි පෙහෙළි කර දුන් සේක. එය වටහා ගැනීමට දක්ෂ වූවෝ උපත හා මරණයෙන් පිටතට පැනගත්තාහු ය.

පුද්ගලයකුට වෙනත් ලොවක උපදිනු පිණිස මරණය විසින් දොර හැර දෙන නමුත් ඔහු සමඟ මෙලොව ගතකළ අය ඔහුගේ වියෝව හේතුවෙන් බොහෝ දුක් විඳිත්. ප්‍රිය විප්‍රයෝගයෙනුත්, අප්‍රිය සම්ප්‍රයෝගයෙනුත් පහස්නා ලද ඔවුහු හෙළනා කඳුළු මෙ පමණකි'යි කිව නොහැකි ය.

ජීවිතය හමුවන වාරයක් පාසා මරණය ද හමුවේ. මැරෙන වාරයක් පාසා බොහෝ දුක් දොම්නස් විඳින්න සිදුවේ. එය කෙතරම් සුවිශාල දැයි වටහා ගැනීමට භාග්‍යවතුන් වහන්සේ වදාළේ මෙ කරුණ ය.

'මහණෙනි, ඉපිද ඉපිද මැරී මැරී යන්න පටන් ගත් මේ දුක්ඛිත ජීවන රටාව කවදා කොතැනෙක කෙසේ පටන්ගත් දෙයක් දැයි එහි මුලක් සෙවීම නම් කිසිසේත් නොදැක්ක හැකි දෙයකි.

එහි මුල නොපෙනේ. ඒ තරම් ම කාලයක් ගෙවී ඇත්තේ ය. අවිද්‍යාවෙන් සැබෑ තතු වැසීගොස්, තණ්හාවෙන් බැඳී ගොස් යළි යළි ඉපිද මැරී යන මේ ගමන් මගේ ආ දුර සුළුපටු නොවේ.

කල්ප කෝටි ගණනකිනුත් කිව නොහැකි තරම් අතීතයක් සියලු සතුන්ගේ ජීවිත කතාවෙහි ඇත්තේ ය. මේ සා අති දීර්ඝ කාලයක් විඳින ලද්දේ සුළුපටු දුකක් නම් නොවේ.

මහණෙනි, මේ ගැන කිමෙක් සිතන්නේ ද? ඉතාමත් වැඩි කිමෙක් ද? මේ සා මහා දීර්ඝ කාලයක් පුරා ගෙවී ගිය ඈත අතීතයක ඒ ඒ අත්බැව්හි අප්‍රියයන් හා එක්වීම නිසාත්, ප්‍රියයන්ගෙන් වෙන්වීම නිසාත් හඬා වැළපීමෙන් ඔබගෙන් වැගිර ගිය කඳුළු ද වැඩි? නැතහොත් සිව් මහා සමුදුරෙහි ජලය ද?

'ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ වදාළ දහම තුළින් ජීවිතය දෙස බැලිය යුතු දැක්මෙන් බලන කල්හි අප ද වටහාගෙන සිටිනුයේ මෙලෙස ය.

මේ සා මහත් දීර්ඝ කාලයක් පුරා ගෙවුණු මහත් අතීතයේ, ඒ ඒ අත්බැව්හි අප්‍රියයන් හා එක්වීමෙනුත්, ප්‍රියයන්ගෙන් වෙන්වීමෙනුත් දරාගත නොහැකි සෝ දුකින් හඬා වැළැපෙන කල්හි අප නෙතින් වැගිර ගිය කඳුළු ම බොහෝ ය. සිව් මහ සමුදුරෙහි ජලය එතරම් නැත්තේ ය.'

'මැනවි, මැනවි මහණෙනි, සැබැවින් ම එය එසේ ම ය. මා දෙසූ දහමින් දිවියේ සැබෑ තතු දෙස බැලූ අයුරු මැනවි. ඔබ විසින් මේ සා මහත් දිගු කලක් මුළුල්ලේ ගෙවී ගිය සුවිසල් අතීතයෙහි ඒ ඒ අත්බැව්හි අප්‍රියයන් හා එක්වීමෙනුත්, ප්‍රියයන්ගෙන් වෙන්වීමෙනුත් දරා ගත නොහැකි සෝ දුකින් වැළපුණු තොප නෙතින් වැගිර ගිය කඳුළු බොහෝ ය. සිව් මහා සමුදුරෙහි යම් ජලයක් ඇද්ද, එහි එතරම් නැත්තේ ය.

මහණෙනි, මේ සා දිගු අතීතයේ ඒ ඒ අත්බැව්හි ඔබගේ මවගේ මරණයට පත්වීම හේතුවෙන් සෝක දුකින් පහස්නා ලදුව වැළපෙන නෙතින් වගුළ කඳුළු ම බොහෝ ය. සිව් මහ සමුදුරු ජලය එතරම් නැත්තේ ය.

හෙලූ කඳුළු පිළිබඳ කතාව එපමණකින් නිමා නොවේ. ඒ ඒ අත්බැව්හි තොප පියාගේ මරණයෙනුත්, සොයුරු සොයුරියන්ගේ මරණයෙනුත්, අඹුදරුවන්ගේ මරණයෙනුත්, නෑසියන්ගේ මරණයෙනුත්, තමන් සතුව තිබූ උපභෝග පරිභෝග වස්තූන් නැසීයාමෙනුත්, බිහිසුණු රෝ දුක්වලට බඳුන් වීමෙනුත් අකැමැති දෙය ම ඔබ හා එක්විය.

කැමති දෙය ම ඔබගෙන් වෙන් විය. එකල්හි දරා ගත නොහැකි සෝදුකින් පහර කන ලදුව නෙතින් වගුළ කඳුළු ම ඉතා බොහෝ ය. සිව් මහ සමුදුරෙහි ජලය එතරම් නැත්තේ ය.

එහෙයින් මහණෙනි, මෙසේ ඉපිද ඉපිද මැරී මැරී යන දුක්ඛිත ජීවන රටාවට මෙසේ ගොදුරු වී සිටීම ගැන කළකිරිය යුතු නොවේ ද? නොඇලිය යුතු නොවේද? මේ දුක්ඛිත ඉරණමෙන් නිදහස් විය යුතු නොවේද?

වරක් භාග්‍යවතුන් වහන්සේ උපමාවෙකින් ඉපදෙන මැරෙන කතාව පැහැදිලි කළ සේක. 'මහණෙනි, ලී දණ්ඩක් අහසෙහි උඩට වේගයෙන් දැමූ විට වරෙක මුලින් වැටේ. තව වරෙක මැදින් වැටේ. යළි අගින් වැටේ. එක ම ආකාරයෙන් එක ම රටාවට නොවැටේ.

මහණෙනි, මේ සත්වයාට සිදුවූයේ ද මෙබඳු ම දෙයකි. අවිද්‍යාවෙන් වැසී, තණ්හාවෙන් ගැටගැසී කර්ම විපාකයට හසුවී වරෙක මැරී වෙනත් ලොවෙක යයි. එතැනින් මැරී තව ලොවකට යයි. එතැනින් මැරී තවත් ලොවකට යයි. එතැනින් මැරී යළි මෙලොව එයි. යළි මෙලොවින් වෙනත් ලොවක යයි. ඉමක් කොණක් නොමැතිව හිස හැරුණු අත ඉබාගාතේ යන ලෙසින් මෙසේ ඉපදෙන්නටත් මැරෙන්නටත් සිදුවූයේ කුමක් නිසා ද? මේ සා මහත් අතීතයේ දිගු කලක සිට අවිද්‍යාවෙන් වැසී තණ්හාවෙන් ගැටගැසී කර්ම විපාකයට සිරවෙන්නට සිදුවූ නිසා ය.

වරක් භාග්‍යවතුන් වහන්සේ වදාළේ මෙසේ ය. 'මහණෙනි, මේ සා අති දීර්ඝ කාලයක ගෙවී ගිය මහත් අතීතයේ එක් කල්පයක දී එක් පුද්ගලයකු මැරී මැරී යන වාර ගණන දෙස බලන්නේ නම්, ඒ මෙසේ ය.

ඔහු උපන් වාර ගණනේ දී ඒ කල්පය පුරා මරණයට පත්වන වාරයක් පාසා අත්හළ ඇටසැකිළි ගොඩගැසුවේ නම්, එසේ ගොඩගසන ලද ඇටසැකිලි නොදිරා ගියේ නම්, මේ සා විශාල වූ විපුලගිරි පර්වතය තරම් උඩට ගොඩගැසෙන්නේ ය. එසේ වූයේ මන්ද?

දුර ඈත සෙනසුනෙක විසූ තිහක් පමණ භික්ෂු පිරිසක් භාග්‍යවතුන් වහන්සේ බැහැදැක වන්දනා කරගනු පිණිස රජගහ නුවර වේළුවනයට පැමිණියෝ ය.

ඒ භික්ෂූන් දෙස බැලූ භාග්‍යවතුන් වහන්සේ තුළ මේ අදහස ඇති විය. 'පාවා නුවර වැසි තිස්නමක් පමණ වූ භික්ෂූහු හැමදෙන අරණ්‍යවාසීහු ය.

ගෙපිළිවෙළින් පිඬුසිඟා පමණක් දන් වළඳන්නෝ ය. පාංශුකූල සිවුරු පමණක් දරන්නෝ ය. එහෙත් තවමත් මේ භික්ෂූන්ගේ සිත් ඉපදෙන මැරෙන ලෝකයට ගැටගැසී ඇත්තේ ය. මේ හිඳින තැන දී ම ඒ සියලු ක්ලේශ බන්ධනයන්ගෙන් මේ භික්ෂූන්ගේ සිත් නිදහස් වන අයුරෙන් දහමක් දෙසුව මනා ය.' මෙසේ සිතූ භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.


'මහණෙනි, මේ සා අති දීර්ඝ කාලයක් මහත් අතීතයක් පුරා ගෙවී ගිය අනන්ත කාලයෙහි ඉපදෙමින් මැරෙමින් ඔබ මෙතෙක් පැමිණි ජීවන රටාවේ මූලාරම්භයක් දැක්ක නොහැක්කේ ය.

එහි අක්මුල් නොපෙනේ. මේ රටාවට හසු වූ සත්වයෝ අවිද්‍යාවෙන් මුළා ව, තණ්හාවෙන් ගැටගැසී කර්මයට දාස ව සිටිති. ඔබට සිදුවූයේත් එය මය.

මහණෙනි, මේ සා දිගු කලෙක, ගෙවී ගිය මහ අතීතයෙක ඔබ ගවයන් ව උපන් කල ගෙල සිඳින ලදුව මැරීයාමේ දී ගලා ගිය රුධිරය.... මීගවයන් ව උපන් කල... එළුවන් ව උපන් කල... බැටළුවන් ව උපන් කල... මුවන් ව උපන් කල... ඌරන් ව උපන් කල.... කුකුළන් ව උපන් කල.... නේක සතුන් ව උපන් කල.... මනුලොව ඉපිද ගම් පහරන සොරුන් ව සිටි කල දඬුවම් ලැබ.... මනුලොව ඉපිද පර අඹුවන් කරා ගොස් හසුවී දඬුවම් ලැබ..... තොප නොයෙක් අරගල, යුද කෝලාහලවලට හසුවී ඒ ඒ තැන ගෙල සිඳින ලදුව මරණයට පත්වීමෙන් ගලා ගිය යම් රුධිරයක් ඇද්ද, එය ඉතා වැඩි ය. සිව් මහා සමුදුරු ජලය නොවේ.

මෙවන් අතිදුක්ඛිත ඉරණමකට තොප ගොදුරු වූයේ මක් නිසා ද? මහණෙනි, මේ සා මහ දිගු කලක්, ගෙවීගිය මහා අතීතයක් පුරා ඒ ඒ අත්බැව්හි ඉපදෙන්නටත්, මැරෙන්නටත් සිදුවන ඉරණමට හසුවීම නිසා ය. ගෙල සිඳුනු ලැබ සිව් මහා සමුදුරු ජලය ඉක්මවා ගිය රුධිරය ම වැඩි වූයේ, ඉපදෙන මැරෙන දුක්ඛිත ඉරණමට මෙසේ හසුවී සිටීම නිසා නම්, ඒ ගැන තොප කළකිරිය යුතු නොවේද? නොඇළිය යුතු නොවේ ද? මේ දුක්ඛිත ඉරණමෙන් නිදහස් විය යුතු නොවේද?'

භාග්‍යවතුන් වහන්සේ වදාළේ පිටස්තර පුද්ගලයකුගේ ඉරණම පිළිබඳ උපුටා දක්වා අසවලාට වූ දේ බලන්නට කියා නොවේ. තම තමන්ගේ අක්මුල් නොපෙනෙන අතීතයේ සැඟව ගිය කඳුළු පිරි යටගියාව ගැන ය. සාගර ජලය ඉක්ම යන තුරු ලේ කඳුළු ගලා ගිය, ඉපදෙන මැරෙන දුක්ඛිත ඉරණම ගැන ය. එහි සැබෑ තතු නොදැන තමාගේ ම ඇසටත්, කනටත්, නාසයටත්, දිවටත්, කයටත්, මනසටත් තණ්හාවෙන් ගැටගැසී සිටීම ගැන ය. ඇසින් දක්නා රූපයටත්, කනින් ඇසෙනා ශබ්දයටත්, නාසයෙන් දැනෙනා ගන්ධයටත්, දිවට දැනෙනා රසයටත්, කයට දැනෙනා පහසටත්, සිතෙහි මැවෙනා ලොවටත් තණ්හාවෙන් ගැටගැසී සිටීම ගැන ය.



එහි ම ඇලී ගැලී සිටීම ගැන ය. එනිසා ම තමා මුහුණ දුන් දුක්ඛිත ඉරණම ගැන ය.

ඒ තිහක් පමණ වූ භික්ෂූන්ට තමන්ගේ ම අතීතය පිළිබඳ සැබෑ චිත්‍රය මැනවින් දිස්වූයේ ය. වඩවඩාත් පැහැදිලි ව වැටහී ගියේ ය. අවිද්‍යාවෙන් වැසී, තණ්හාවෙන් ගැටගැසී කර්මයට දාස ව බිහිසුණු ඉරණමක සිරවී සිටි බව වැටහී ගියේ ය. ඔවුන්ගේ නුවණැස පෑදුණේ ය. ගැටගැසී තිබූ හැම කෙලෙස් බැම් ලෙහුණේ ය.

ඉපදෙන මැරෙන රටාවෙන් පිටතට පැනගත් අය මරණය දිනුවෝ ය. ඉන් පසු ඔවුනට ඉපදීමත් මරණයත් කිසිසේත් අදාළ නැත. එය ඔවුන්ගේ විෂයයට අයත් නැත. ඒ භූමියෙහි ඔවුන් නැත.

ලෝකයෙන් එතෙර වීම යනු මෙය ය. මරණයට යට නොවී මරණය පරදවාලීම යනු මෙය ය. එවන් නිකෙලෙස් උතුමකු වයසින් කුඩා වුව ද සිතන රටාවෙන් ගාම්භීර ය.

භාග්‍යවතුන් වහන්සේ ජීවමාන ව වැඩසිටි සමයෙහි රජගහ නුවර එක්තරා දරුවෙක් බුදුසසුනෙහි පැවිද්ද ලබා ගත්තේ ය. ඔහු වයසින් කුඩා නමුත් නුවණින් වැඩිහිටියෙකි. ඒ දරු තෙමේ සාමණේර භූමියේ සිටිය දී ම ඉපදෙන මැරෙන දුක්ඛිත ඉරණමෙන් පිටතට පැන ගන්න සමත් වූයේ ය. දැන් ඒ හෙරණ නමගේ සිත උපතට හෝ මරණයට අයත් නැත්තේ ය. එයින් නිදහස් ය.

ඒ කුඩා රහත් හෙරණගේ නම අධිමුත්ත ය. හේ තවත් සඟ පිරිසක් හා වස් වසනු පිණිස ඈත පිටිසර වනගත පෙදෙසකට පිටත් විය. සැටනමක් පමණ වූ සඟ පිරිසට උවටැන් කරන මේ නිහතමානී සාමණේරයන් මරණය දිනුවෙක් බවත්, ජීවිතයත් මරණයත් පොරබදින දුක්ඛිත සසර සයුර තරණය කළ අයකු බවත් කිසිවකුට දැනගත නොහැකි විය.

කුඩා භික්ෂුවක් ව සිට පවා සිය සිතෙහි ඇති අද්භූත වෛරාග්‍යයෙන් නිපන් සිතැඟි අන්‍යයන්ට නොපවසා එදෙස උපේක්ෂාවෙන් බැලීම මරණය දිනුවන්ගේ ලකුණෙකි.

ඒ වනයේ දරුණු සොරමුලක් සැරිසැරූහ. ඔවුහු වන ගැබෙහි ඇති වනස්පති මහා වෘක්ෂයකට අරක්ගත් යකින්නක උදෙසා වාර්ෂිකව මිනිස් බිල්ලක් දෙන්නට පොරොන්දු ව සිටියෝ ය.

මෙවර ඒ මිනිස් බිල්ලට සුදුසු අයකු සොයන විට ඒ වන අසපුවෙන් බැහැර පිටත් ව ගිය තරබාරු මහල්ලකු හමුවිය. මහල්ලා කියා සිටියේ තමා වැනි ජරපත් මාල්ලකු බිල්ලට දීමෙන් තොපගේ දේව මාතාව සතුටු නොකළ හැකි බව ය. 'ඉදින් ගුණ නුවණැති සුසිල්වතකු බිළිදිය හැකි නොවේද? එකල්හි ඒ දේව මාතාවෝ තොප කෙරෙහි පහන් වන්නී තොප රකින්නී නොවේ ද? එබඳු තපස්වීහු අසවල් තැන සිටිත්. ම වැන්නකු කුමට?'දැ යි කීවේ ය.

මෙය අදහාගත් සොරුන්ගේ සිත් එදෙසට යොමු විය. ඔවුහු ආරණ්‍යය වටකළෝ ය. වැඩිහිටි තෙරවරුන් එකිනෙකා සොරු සමඟ යන්ට පෙළ ගැසෙන්නට පටන් ගත් විට අධිමුත්ත හෙරණ නම ඒ හැම වළකා තෙමේ ම ඉදිරිපත් විය.

සොරමුල පොඩිනමත් රැගෙන වනස්පතී මහා වෘක්ෂය වෙත ගියේ ය. අවට මහා අඳුරු සෙවණැලි වසා මූසල නිහැඬියාවකින් පිරී ගිය තැනෙකි. සිංගාරයන්ගෙන් තැන තැන රත්පැහැ ගන්වා, වදමල් පුදා, සිහින් රතුවතින් පිරිකෙව් කොට තිබිණ. රුක් සෙවණේ යහනක හැඩය ගත් ගලක් තැන්පත් ව තිබිණ. හෙරණ නම එහි හිඳුවීය. අරණ්‍යයෙහි දී මුණගැසෙන කල්හි පොඩිනමගේ මුව මඬලෙහි තිබුණේ යම් සිරියාවෙක් ද, එය නොවෙනස් ව එලෙසින් ම තිබුණේ ය. ඒ මඳ සිනහවෙන් ද දිගටම මුව සැරසී තිබුණේ ය. කඩුවෙන් සිඳ මරණයට පත්කොට බිලිදෙන්ට සූදානම් ව හිඳුවා සිටින මේ ළදරු පැවිද්දාට එහි වගක් නැති සේ ය. මරණය යනු කුමක්දැයි නොදන්නා සේ ය. මැරෙනවුන් දැක නැති සේ ය. මරණෙන් භ්‍රාන්ත වූවන්ගේ වියරු විලාපය කිසි දින අසා නැති සේ ය.

සොර දෙටුවා පොඩිනම දෙස නෙතු පිය නොසලා බලා සිටියේ ය. හාත්පස පහන් දල්වා, වදමල් පුදා යකින්නට බිලි පුද දෙනු පිණිස ස්තෝත්‍ර කියැවේ. සීනුහඬ නැංවේ. උඩැක්කි වැයේ. මේ කුඩා ශ්‍රමණයාණන් දෙස බලා සිටි සොර දෙටුවාට පුදුම නොවී සිටින්නට බැරි විය. මොහු උමතු වූවෙක් ද? සිහිකල්පනාව නැති වූවෙක් ද? මෙසේ නොවෙනස් වූ මඳ සිනහවෙකින් නිර්භය දෙනෙතින් සුව සේ බලා සිටිනුයේ කෙසේ ද? දැන් බිල්ලට කැපවන බව නොදන්නේ ද? හේ යාදින්න මඬකට නවත්වා දේව මාතාවට බිළිදෙන්ට කැප කළ කුඩා ශ්‍රමණ නමගෙන් මෙසේ විචාළේ ය.

එම්බා දරුව අප පෙර, අල්වා මෙතැන ගෙන ආවුන් කැප කරද්දී
බිල්ලට වැළපේ. වනය
දෙවනත් කොට පැහැර
ගැනුමට ධනය, නැසුමට
කඩු එසවූ විට සියලු වස්තුව
පුදා, ඉල්ලුවෝ ම ය ජීවිත.
සලිත ව මරණ
බියෙන්, වියරු වැටී ගිය ඔවුහු
සිහිසුන් ව
වැටුණෝ, බැගෑ හඬ නැගුවෝ
වගුළෝය බොහෝ කඳුළු,
ගැහි ගැහී සිටියෝ
තොප මහ අමුතු යැ,
බිය තැතිගැනුම් නැත කිසිත්
මරණය ළං ව එන විට,
තොප පැහැ දිලේ වැඩියෙන්
අසිපතින් වටකොට,
මරණය යි තොප කැඳවන
මෙවන් මොහොතක කිම,
නොහඬා නොවැළපී
අමුතු සන්සුන් බවෙකින්,
වෙනසක් නැතිව ඉන්නේ?

එකල්හි ඒ පොඩිනම කිසි වෙනසක් නොදක්වා සතුටු පිරුණු මුව මඬලින් යුතුව, නිදහස් සිතින් යුතුව, බිය තැතිගැනීමක් යනු කුමක්දැයි නොදන්නා සිතින් යුතුව, මරණය පිළිබඳ තමන් තුළ ඇත්තේ කවර දැක්මෙක්දැයි සොර දෙටුවාට පහදා දුන්නේ ය.

එම්බා මිතුර අසව මා බස,
දිවියේ ඉදිරි මොහොතට
පවතින්ට කිසි ලෙසට, ඕනෑකමක් නැතියකුට
මරණය පැමිණි විට, බියවන්ට
කරුණෙක් නැත
ගැටගැසී තිබූ හැම කෙලෙස්,
මැනවින් ලිහා ගත්විට
බිය තැතිගැනීම්වලින්, ඔහු
පිටට පැන ගත්තෙකි

උතුම් අරිඅටඟි මඟ වැඩී
ඇත මා තුළ හොඳින්
ඒ මඟ මනාකොට ප්‍රගුණ වී ඇත මා හට
දුකින් විඳ වූ රෝගයක්,
සුව වූ අයකුහට
රෝගයක් තමාහට,
තිබුණු බවවත් සිහි නැත
එලෙසින් ම මා හට,
මරණ බිය තිබුණු බවවත්
කිසි මතකයක් නැත

හොඳින් දමනය කොට සිත
නැණින් දැන ඇති තතු
විමුක්තිය පසක් කළ විට
සැබෑ අස්වැසිල්ලක්, නොපවතින මේ ලොව
පවතින නිසරු බව යස රඟට දිස්වේ
විසක් වමනය කොට, සුවපත් වූ අයකු ලෙස
මරණය ද මා හට වමනය
කළ විසක් බඳු වේ

ඉපදෙමින් මැරෙමින්, හැඬු
කඳුළින් එයට මැදි වී
ඉතා දුකසේ ආ රටාවෙන් පිටට පැන්නෙමි
කිසිවකට කිසිදු අයුරින්
පැටලී නොමැත මේ සිත
මෙලෙසින් නිදහස් වූ විට
කළ යුත්ත කොට හමාර ය
මරණයේ දංගෙඩියෙන්, මිදීගත් අයකු ලෙස
ආයුෂ ගෙවීගිය හෙයින් ඒ ගැන සතුටු වෙමි

මා ඇසූ දරාගත්, දහම අති උත්තම වේ
එදහම කියූ තැනට ම මගේ සිත පත් වී ඇත
මෙලොව පරලොව ගැන
මසිතෙහි හැඟීමෙක් නැත
නිදහස් වූ සිතට කිසිදු
පැතුමක් අදාළත් නැත
ගිනිගත් ගෙයින් පිට පැන
සුව ලැබූවෙක් විලසට
මරණය ඉදිරියෙහි නොඒ සෝදුක් මසිතට

තොපට මේ කය ගෙන,
කරන්නට ඇත්නම් යමක්
බිලි පුදට හෝ අනිකකට
යමක් කරනට සිතවී නම්
තොපට රිසි සේ කරව් ඒ
දෙය ඒ ගැන කිසිවිටක
ගැටීමක් හෝ ඇලීමක්
නැත්තේ ය මා සිත තුළ

සිය මරණය ගැන අල්පමාත්‍ර වූ සංවේදී බවක් නොමැති,මරණයට අයත් නැති, මරණය දිනූ ඒ කුඩා රහත් නමගේ වදන් ඇසූ සොරුන්ගේ කය ලොමුඩැහැ ගැනුණේ ය.

අනේ පින්වත් ළදරු ශ්‍රමණය
කෙසේ නම් අදහගන්ට ද
මෙවන් බබළන නුවණක්
එළිය විහිදෙන අසිරිමත් බස්
කවුද මෙවන් අරුම පුදුම දේ
තොපට පැවසූ ගුරු දෙව්?
කවරෙකු වෙත අවුත්
ලද්දේ ද තොප මේ සෝක නැති බව?

එවිට අධිමුත්ත සාමණේර තෙමේ භාග්‍යවතුන් වහන්සේ ගැන ඔවුනට කියා දුන්හ.

මාගේ ගුරුදෙවිඳු, දනිති
ලොව ඇති සැම දෙය
ඒ සම්බුදු නුවණට විවර වී
ඇත සියලු ලෝ තතු
ලෝ සතගෙ හැම භව දුක්,
නිමා කරනා අම ඔසු
තුන්ලොව සිසාරා සියලු සත
වෙත බෙදා දෙනුයේ
ඒ මගේ භගවත් මුනිඳු ය
ඒ මුනිඳුගේ සසුනේ මම් ලදිමි
මේ සෝක නැති බව

ජීවිතයේ පළමු වතාවට ඔවුන් දුටු ඉතා අද්භූත ලොමු ඩැහැගැන්වෙන සිදුවීම මෙය විය. සොරුන්ගේ කටයුතු එතැනින් ම හමාර විය. ඔවුහු සොරකම අත්හළෝ ය. ඔවුන්ගෙන් ඇතැමෙක් පැවිද්ද ලබා ගත්තෝ ය. එදා බිලි පුදසුන මත හුන් පොඩිනමගේ මුවින් පිටවූයේ යම් දෙයක් ද, ඒ සියල්ල එලෙසින් ම සැබෑ විය. ඉපදෙන මැරෙන දුක්ඛිත ඉරණමේ සිර වී වූසු ඔවුන්ට ද එයින් පැනගන්ට හැකි විය.



# පින් වැඩෙන පින්කෙත

# අනුරාධපුර පූජනීය අටමස්ථානය

**වර්තමාන ශ්‍රී ලංකාවේ උතුරුමැද පළාතේ අගනගරය අනුරාධපුරය යි. අනුරාධපුරයේ ආරම්භය ක්‍රි.පූ. සයවැනි සියවස තෙක් ඈත අතීතයට දිව යයි. විජය රජුගේ ඇමතියකු වූ අනුරාධ නැමැත්තා ස්වකීය නාමය මුල් කොටගෙන අනුරාධගාම නමින් ග්‍රාමයක් ඉදි කළේ ය.**

එයට වසර කිහිපයකට පසුව තවත් අනුරාධ නම් කුමරෙක් වාසස්ථානයක් හා වැවක් ද තනාගෙන එහිම විසුවේ ය. අනුරාධ ග්‍රාමයේ ආරම්භය ගැන කරුණු දක්වන මහාවංසය අනුරාධ නම් කුමරුන් දෙදෙනකුට වාසභූමි වීම හා අනුරාධ නම් නැකතින් ඉදිකරවීම යන කරුණු සඳහන් කරයි.

11 වැනි ශත වර්ෂය මුල දී සිංහල රාජ්‍යය සොළීන්ට යටත් වන තෙක්ම කෙටි කාලයක් හැරුණුවිට සෑම රජකුගේ ම වාසස්ථානය වූයේ අනුරාධපුරය යි. එබැවින් එදා එය ශ්‍රී ලංකාවේ අගනුවර ද වූයේ ය.

පුරාතනයේ පටන්ම ලංකාවේ ප්‍රධාන සිද්ධස්ථාන වශයෙන් සැලකෙන සොළොස් තැනක් ( 16) තිබෙන බව මහියංගනං නාගදීපං යනාදී පාලි ගාථාව අනුව පෙනේ. මෙම සිද්ධස්ථාන දහසය අතුරෙන් ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි මහා සෑය, මිරිසවැටිය, ථූපාරාමය, අභයගිරිය, ජේතවනාරාමය හා සේල චෛත්‍යය යන ස්ථාන හතම පිහිටා තිබෙන්නේ ඓතිහාසික අනුරාධපුර ශුද්ධ නගරයේ ය.

## අටමස්ථානය

අනුරාධපුරය ආශ්‍රිතව පිහිටා ඇති අටමස්ථානය පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීමේ දී අටමස්ථානය නමින් හැඳින් වූ සිද්ධස්ථාන කලින් කල වෙනස්වී ඇති බව දත හැකි ය. ප්‍රථමවරට අටමස්ථානය යන වචනය සඳහන් ව ඇත්තේ දඹදෙණි සමයේ රචිත පූජාවලියෙහි ය. ඒ මෙසේ ය.

අනුරාධපුර නුවරට වැඩ දකුණු මහ සෑය පිහිටි තැන මහමෙවුනා උයන් මැද, ශ්‍රී මහා බෝධිය පිහිටි තැන, ලෝවාමහාපාය පිහිටි තැන, පිරිත් ලා ගෙය පිහිටි තැන, දන්තාදර නම් පොකුණ පිහිටි තැන, ථූපාරාමය පිහිටි තැන, පතස් භූමියෙහි රුවන්වැලි මහ සෑය පිහිටි තැන, මිහින්තලයෙහි මහ සල සෑය පිහිටි තැන යැයි යන මේ අටමස්ථාන ය.

සද්ධර්මාලංකාරයේ සඳහන් වන අන්දමට අටමස්ථානය වශයෙන් හැඳින්වෙන ස්ථාන මෙසේ ය. “ මහමෙවුනා උයනේ රජගෙට දකුණු දිගින් පිහිටි මාලක සීමාව, උතුරින් පිහිටි ඡන්තඝර නම් පොකුණ, නැගෙනහිර වාසල් දොර, මහා බෝධිස්ථානය, ලෝවාමහාප්‍රාසාදය, ලහබත්ගෙය, චතුස්ශාලාව පිහිටි ස්ථානය, මහා භෝජන ශාලාව, රත්නමාලි චෛත්‍යස්ථානය.

පූජාවලියේ අටමස්ථානය ලෙස සැලකෙන ස්ථානයන්ගෙන් ථූපාරාමය හා මිහින්තලයේ මහසල සෑය සද්ධර්මාලංකාරයේ පූර්වෝක්ත ලැයිස්තුවෙන් ඉවත් වී තිබේ. මේ අනුව පැහැදිලි වනුයේ අටමස්ථානය යනුවෙන් පිළිගත් විශේෂ සිද්ධස්ථාන 08ක් අනුරාධපුරයේ පැවැති බවත්, කලින් කලට ඒවා වෙනස් වූ බවත් ය. අනුරාධපුර රාජධානිය පරිහාණියට පත්ව ජනශූන්‍ය ප්‍රදේශයක් වීමෙන් පසුව එහි වෙහෙර විහාර ද ක්‍රමයෙන් ගරා වැටෙන්නට වූ හෙයින් ඒවා හඳුනාගැන්ම ද දුෂ්කර විය. ඒ අනුව වර්ෂ 1872 දී එවක ආණ්ඩුව නිකුත් කර ඇති ලේඛනයක් මඟින් යළි අටමස්ථානය පිළිබඳ සංශෝධනයක් සිදු කොට තිබේ. අටමස්ථානයට අයත් භූමි ප්‍රමාණයන් ද වෙන්කොට දී ඇති එම වාර්තාවේ අටමස්ථානය ලෙස නම් කොට ඇත්තේ පහත සඳහන් සිද්ධස්ථාන යි.

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා විහාරය, ලංකාරාමය, ථූපාරාමය, රුවන්වැලි මහා සෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනාරාමය, ලෝවාමහාපාය.

තවද වර්ෂ 1908 දී අටමස්ථාන කොමිටිය නමින් සභාවක් ද පත් කරගෙන තිබේ. වර්ෂ 1909 දී එවක ආණ්ඩුකාරවරයා හා පූර්වෝක්ත සභාවේ සාමාජිකයනුත් අතර සාකච්ඡාවක් පැවැත්විණි. එහිදී අටමස්ථාන කොමිටියේ ලේකම් විසින් අටමස්ථානය වශයෙන් පිළිගත යුතු සිද්ධස්ථාන අටක නාම ලේඛනයක් ඉදිරිපත් කරන ලදී. ඒ මෙසේ ය.

ජය ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි මහා සෑය, ජේතවනාරාමය, අභයගිරිය, මිරිසවැටිය, ලංකාරාමය, ථූපාරාමය, ලෝවාමහාපාය

දැනට අනුරාධපුර අටමස්ථානය වශයෙන් ද සලකනුයේ මෙම සිද්ධස්ථාන අටයි. ශ්‍රී ලංකාවේ නොයෙකුත් පළාත්වලින් අනුරාධපුරයට වන්දනාවේ පැමිණෙන සැදැහැවතුන් වඳින්න යන ස්ථාන හතකුත් , බලන්න යන ස්ථානයකුත් මෙසේ අටමස්ථානය වශයෙන් ප්‍රසිද්ධියට පත්ව තිබේ.

ඒ අනුව වඳින්න යන ස්ථාන වනුයේ ඉහත දැක්වූ ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ පටන් ථූපාරාමය දක්වා වූ සිද්ධස්ථාන හතයි. බලන්න යන ස්ථානය වනුයේ ලෝවාමහාපාය යි. වර්ෂ 1909 දී රජයේ පාලනයෙන් නිදහස් කෙරුණු මෙම බෞද්ධ සිද්ධස්ථාන අද දක්වා පාලනය වන්නේ අනුරාධපුර අටමස්ථානාධිපති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු කාරක සභාවක් මඟිනි.

## ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ

දැනට පිළිගෙන තිබෙන අනුරාධපුරයේ පූජනීය ස්ථාන අටෙන් පළමුවැන්න ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ය. එය අනුරාධපුර මහමෙවුනා උයනේ ලෝවාමහාපාය අසල උඩමලුව නමින් හැඳින්වෙන ස්ථානයේ පිහිටා තිබේ. අනුරාධපුරයේ පූජනීය වස්තූන් අතර ඓතිහාසික කීර්තියක් හා උරුමයක් ඇත්තා වූ පූජනීය වස්තුව ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ය.

මෙම බෝධි ශාඛාව ලක්දිවට වැඩමවන ලද්දේ ක්‍රි.පූ 3වන ශත වර්ෂයේ දී ය. දේවානම්පියතිස්ස රජුගේ ඉල්ලීම පරිදි දඹදිව ධර්මාශෝක අධිරාජයාගේ විශේෂ අනුග්‍රහය මත මෙය සිදුවුණි. සංඝමිත්තා මහරහත් තෙරණිය විසින් වැඩම වන ලද මෙම බෝධි ශාඛාව රෝපණය කිරීම සඳහා සුදුසු ස්ථානය තීරණය කළේ මිහිඳු මහරහතන් වහන්සේ විසිනි.

ශ්‍රී මහා බෝධිය රෝපණය කොට තිබෙන්නේ පොළොව මට්ටමෙන් උස්ව පිහිටි වේදිකා තුනකින් සමන්විත මලුවේ ඉහළම තලයෙහි ය. පොළෝ මට්ටමේ සිට බෝධීන් වහන්සේ පිහිටි ඉහළම මලුවට අඩි 21ක් පමණ උස ය. බෝධිය වටකොට තනවා ඇති රන්වැට දක්නට ලැබෙන්නේ මෙම මලුව වටා ය. ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිහිටි භූමියේ තවත් පරිවාර බෝධීන් වහන්සේ රැසක් රෝපණය කර තිබේ. ඒ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආරක්ෂාව සඳහා ය. පහළ මලුව වටා බැඳ ඇති අඩි 5ක් පමණ ඝනකම ඇති අඩි 10 -12ක් පමණ උස සුවිසල් ප්‍රාකාරයක් වේ. මෙය එක් පැත්තක් අඩි 350ක් ද, අනෙක් පැත්ත අඩි 275ක් ද දිග ය.

අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට අධිගෘහිතව සිටින්නේ කළුදේවතා බණ්ඩාර යන දේශීය නමින් හැඳින්වෙන විෂ්ණු දෙවියන් බව සාම්ප්‍රදායික පිළිගැනීම යි.

ශ්‍රී මහා බෝධිය උදෙසා පැවැත්වෙන ආගමික පූජා අතුරෙන් අලුත් සහල් මංගල්‍යයට සුවිශේෂී ස්ථානයක් හිමි වෙයි. එසේම අලුත් අවුරුදු මංගල්‍යය ද, පැරැණි අවුරුදු මංගල්‍යය හා කාර්තික මංගල්‍යය යන උත්සව ද ශ්‍රී මහා බෝධින් වහන්සේ හා බැඳුණු ආගමික උත්සව කිහිපයකි. වර්ෂ 2003 දී ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දෙවැනි මලුව වටා ද අලංකාර රන් වැටක් ඉදි කරවීම මෙහිදී තවත් සැලකිය යුතු කරුණකි.

## රුවන්වැලි මහා සෑය

සිංහල බෞද්ධයන්ගේ ශ්‍රේෂ්ඨතම චෛත්‍යය වශයෙන් සැලකෙන රුවන්වැලි මහා සෑය පිළිබඳ මහාවංසයේ සඳහන් ව ඇත්තේ මහාථූප යනුවෙනි. මහාථූපය තැනවීම පිළිබඳ ප්‍රවෘත්තිය මහාවංසයේ ද, ථූපවංසයේ ද සවිස්තරාත්මකව දක්වා තිබේ.

ස්තූපය තැනවීම ආරම්භ කිරීමේ උත්සවය අනුරාධපුරයේ සිදු වූ ඉතාමත් අලංකාර උත්සවයක් ලෙස වංශකතාවන්හි සඳහන් වෙයි. ස්තූපයේ කටයුතු අවසන් වීමට පෙර දුටුගැමුණු රජු මියගියෙන් සද්ධාතිස්ස රජු ස්තූපයේ ඉතිරි කොටස් නිම කළේය. ස්තූපය වටා ඇති ඇත් පවුර සාදවන ලද්දේ ද සද්ධාතිස්ස රජු විසිනි. ඉන්පසුව තවත් බොහෝ රජවරු මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු හා නව කර්මාන්ත කළහ.

ස්තූපය එකල අඩි 120ක් උස විය. සාංචි හා භාරුත් ස්තූපයන්ට සමාන නිර්මාණ ලක්ෂණ දරන මෙම ස්තූපය අත්තිවාරමේ සිට අවසානය දක්වාම ඉතා පරීක්ෂාවෙන් තනවා ඇති බව වංශ කතා විස්තරයෙන් පෙනේ. මෙම ස්තූප කර්මාන්තයෙහි යෙදෙන කිසිවකුට කුලී නොගෙන වැඩ කිරීම තහනම් කිරීමෙන් ම දුටුගැමුණු රජුගේ අපරිමිත ශ්‍රද්ධාව ප්‍රකට වෙයි.

රුවන්වැලි මහා සෑය ගරා වැටීමෙන් පසු මෑත යුගයේ එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලද්දේ නාරංවිට සුමනසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි. උන්වහන්සේගේ අනුශාසකත්වය යටතේ රත්නමාලි චෛත්‍ය සංවර්ධන සමිතිය මඟින් වර්ෂ 1870 දී මෙම භාරදූර කාර්යය ආරම්භ කෙරිණි. ඒ අනුව එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලද්දේ නාරංවිට සුමනසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

උන්වහන්සේගේ අනුශාසකත්වය යටතේ රත්නමාලි චෛත්‍ය සංවර්ධන සමිතිය මඟින් වර්ෂ 1870 දී භාරදූර කාර්යය ආරම්භ කෙරිණි. ඒ අනුව එම ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කොට වර්ෂ 1840 ජූනි මස 17 වැනි පොසොන් පුර පසළොස්වක පොහෝ දින චූඩා මාණික්‍යය පැළඳවීය. සලපතළ මලුවේ ඉතිරිව තිබූ නටබුන් අනුව සෑදවූ පරිවාර ස්තූප සතරෙහි කොත් පැළඳවූයේ වර්ෂ 1970 දී ය. ප්‍රතිසංස්කරණයට පසු ස්තූපයේ උස අඩි 338 කි. විෂ්කම්භය අඩි 294 කි. පරිමාව අඩි 942 කි. රන් ආලේප කළ කොත සහ චූඩා මාණික්‍යයේ උස අඩි 25 කි. රුවන්වැලි මහා සෑය අක්කර පහක හතරැස් මලුවක් මත පිහිටා තිබේ. මලුවේ එක් පැත්තක දිග අඩි 465 කි. ඒ වටා තිබූ පුරාණ ඇත් පවුර වෙනුවට අලුත් ඇත් පවුරක් තනවා ඇත.

## ජේතවනාරාමය

අනුරාධපුරය දාගැබ් අතර සෙසු හැම දාගැබකට ම වඩා විශාල වූ ජේතවනාරාම දාගැබ මහසෙන් රජු ( ක්‍රි.ව. 276 -304) විසින් කරවන ලද්දකි. මහා පරිමාණ ස්තූපයක් වන මෙය 12 වැනි ශත වර්ෂයේ දී මහා පරාක්‍රමබාහු රජු විසින් ප්‍රතිසංස්කරණය කරන ලදී. අද වන විට එය නටබුන් ස්මාරකයක් ලෙස දක්නට ලැබේ.

ලෝක සංස්කෘතික උරුමයේ බිම්කඩක් ලෙස නම්කොට ඇති ජේතවනාරාම ස්තූපයේ විෂ්කම්භය අඩි 370 කි. දැනට අඩි 231 ක පමණ උසින් යුක්ත වන අතර අතීතයේ දී අඩි 400ක් උස් වූ බව කියැවෙයි. දාගැබ් මලුව අක්කර 7ක බිමක් වසා සිටියි. ස්තූපය වටා වාහල්කඩ සතරකුත්, දාගැබ් මලුව වටා ඇත් පවුරකුත් තනවා තිබේ. බුදුරදුන්ගේ පටී ධාතුවෙහි කොටසක් මෙහි තැන්පත් කොට ඇති බව සඳහන් වෙයි.


## අභයගිරිය

ධම්මරුචි නිකායේ මූලස්ථානය වූ අභයගිරි විහාරයේ ප්‍රධාන ස්මාරකය මෙන්ම පූජනීය ගොඩනැඟිල්ල වනුයේ, අභයගිරි ස්තූපය යි. අනුරාධපුර නගරයට උතුරු දෙසින් පිහිටි මෙම ස්තූපය පැරැණි ශිලා ලිපිවල අබගිරි විහරති උතර මහ චෙත යනුවෙන් සඳහන් වෙයි.

මහා වංසයේ මෙය අභයුත්තර මහාථූප යනුවෙන් දැක්වෙයි. ක්‍රි.පූ 1 වැනි ශත වර්ෂයේ දී යුද්ධයෙන් පරාජය වී පැන ගිය වළගම්බා රජුට ගිරි නිගණ්ඨයා විසූ ආරාමය අසලින් යාමට සිදු විය. එහිදී එහි වාසය කළ අය මහකලු සිංහලයා පැන යනවා යැයි කියා රජුට විහිළු කළ බව මහාවංසයෙහි දැක්වෙයි.

පසු කලෙක දී සතුරන් පළවා හැර ලක් සිහසුන නැවත හිමි කර ගත් එතුමා තම නමේ අග කොටස ද, ගිරි නිගණ්ඨයා ගේ





ඌරුගමුවේ
අස්සජී හිමි

නම ද යෙදෙන පරිදි අභයගිරිය යැයි විහාරයක් කරවීය. එය පූජා කළේ තමාට බොහෝ උපකාර කළ මහාතිස්ස හිමියනට ය.

මුලදී පැවැති අන්දමට අභයගිරි ස්තූපය අඩි 400 ක් උස වූ අතර එය ඉන්දියාවේ කණිෂ්ක රජුගේ අඩි 638ක් උස ස්තූපයට පමණක් දෙවැනි විය. දැනට අභයගිරි විහාරයේ දක්නට ලැබෙන්නේ 12 වැනි ශත වර්ෂයේ දී මහා පරාක්‍රමබාහු රජු විසින් අඩි 350ක් උසට ප්‍රතිසංස්කරණය කරන ලද ස්තූපය යි. මෑත යුගයේ එනම් වර්ෂ 1890 දී යළිත් මෙය ප්‍රතිසංස්කරණය කරවීය. දැනට මෙහි උස අඩි 245 කි. විෂ්කම්භය අඩි 587 කි. සුප්‍රකට සමාධි පිළිමය පිහිටා ඇත්තේ ද අභයගිරි භූමි ප්‍රදේශයේ ය.

## මිරිසවැටිය

දුටුගැමුණු රජු විසින් ප්‍රථමයෙන් ම ඉදි කරවන ලද දාගැබ මිරිසවැටිය යි. මෙය ඉදිකොට තිබෙන්නේ තිසා වැවත්, අභය වැවත් අතර පිහිටි භූමි භාගයක ය. තිසා වැවේ ස්නානයට යන කල දුටුගැමුණු රජතුමාගේ ජයකුන්තය එක්තරා ස්ථානයක සිටුවා ගියේ ය. ස්නානය අවසන් කොට පැමිණි රජතුමාට එය ආපසු ගැනීමට නොහැකි විය. විශ්මය දනවන ලෙස එය එතැනම සවි වී තිබෙනු රජුට දැනිණ. රජු තම ජයකුන්තය වැසෙන සේ දාගැබක් බැඳ වූයේ ය. එය මිරිසවැටිය යි. තව ද සංඝයා වහන්සේට පූජා නොකොට තමන් අනුභව කළ මිරිස් මාළුවක් ගැන සිහිපත් කළ දුටුගැමුණු රජු එයට දඬුවමක් වශයෙන් මෙම ස්තූපය ඉදි කළ බව මහාවංසය කියයි. මිරිසවැටි යන නම ලැබුණේ ඒ නිසා යැයි ද කියවේ.

සිරිලක එක්සේසත් කළ දුටුගැමුණු රජු සිහසුනට පත් වූ පළමුවැනි සතියේ දී ආරම්භ කළ මෙම චෛත්‍යයේ වැඩ අවසන් කිරීමට වසර තුනක් ගත වූයේ ය. 1 වැනි ගජබාහු රජු මෙම චෛත්‍යය විශාල කොට එහි විසූ මහා සංඝයාට ගම් වරයක් ද පූජා කළේ ය. වෝහාරිකතිස්ස රජු ඡත්‍රය ප්‍රතිසංස්කරණය කොට පවුර ද කරවීය. 5 වැනි කාශ්‍යප රජු ස්තූපය හා විහාරයේ සියලු ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කරවීය.

බෞද්ධ පූජනීය වස්තූන් විනාශ කිරිමෙහි යෙදුණු සතුරු ආක්‍රමණිකයන්ගේ ප්‍රහාරවලට මිරිසවැටිය ද හසු වී විනාශ වී පැවති හෙයින් පසුව මහා පරාක්‍රමබාහු රජු එය අසූ රියනක් වන සේ විශාල කළේ ය. මිරිසවැටිය ස්තූපයේ මුලින් තිබුණු උස ගැන මහාවංසයේ සඳහන් නොවේ. පසුව එය ප්‍රතිසංස්කරණය කොට ඇත්තේ අඩි 160ක් උසට ය.

## ලංකාරාමය

වළගම්බා රජු කරවූ සිලසොබ්භඛණ්ඩක චේතිය වර්තමාන ලංකාරාමය ලෙස හඳුනාගෙන තිබේ. රජ බිසව වූ සෝමා දේවිය ගේ ඉල්ලීම මත කරවූ මණිසෝමාරාමය එම ස්තූපය සහිත සංඝාරාමයේ මුල් නම විය. කණිට්ඨතිස්ස රජු එයට විශාල පිරිවෙනක් කරවා ස්තූපයට ථූපඝරයක් ද ඉදි කරවීය. ගෝඨාභය රජු ථූපඝරය ප්‍රතිසංස්කරණය කරවීය.

ලංකාරාම ස්තූපය හා ථූපඝරය දරා සිටින වෘත්තාකාර පාදම වේදිකා දෙකකින් යුක්ත ය. දෙකේම මුළු උස අඩි 8 අඟල් 5කි. පහළ වේදිකාවේ විෂ්කම්භය අඩි 44 අඟල් 2 කි. උස අඩි 03 අඟල් 08කි. යට වේදිකාව ගලින් තනවා තිබේ. උස වේදිකාව මුළුමනින් ම ගඩොලින් තනවා තිබේ. එහි උස අඩි 4 අඟල් 1කි. එහි විෂ්කම්භය අඩි 40 කි.

ලංකාරාම චෛත්‍යයේ විෂ්කම්භය අඩි 38ක් වෙයි. ඉහළ වේදිකාවේ සිට ස්තූපයේ අවශේෂ කොටස් එනම් හතරැස් කොටුව මුදුනට උස අඩි 33 අඟල් 7කි. නැගෙනහිරින් දකුණින් හා උතුරින් පඩි පේළි සහිත දොරටු තුනකි.

## ථූපාරාමය

ථූපාරාමය අනුරාධපුරය මහා ආවාස පහෙන් එකකි. මහින්දාගමනයෙන් පසු ලංකාවේ ඉදි වූ මුල්ම ඓතිහාසික ස්තූපය ථූපාරාමය යි. ලංකාවේ ප්‍රථම බෞද්ධ පාලකයා වූ දේවානම්පියතිස්ස රජු විසින් ඉදිකරවන ලදී. රුවන්වැලි මහා සෑයට මඳක් උතුරු දෙසින් ද, අභයගිරියට දකුණින් ද අභය වැව හෙවත් බසවක්කුලමට ඊසාන දෙසින් ද ථූපාරාමය පිහිටියේ ය.

මෙම දාගැබෙහි නිධන් කොට ඇත්තේ බුදුරදුන්ගේ දකුණු අකු ධාතුන් වහන්සේ බව මහාවංශයේ සඳහන් වෙයි. බුදුරදුන් තෙවැනිවර ලක්දිවට වැඩම වූ අවස්ථාවේ දී සුළු වේලාවක් සමාධියෙන් වැඩ සිටීමෙන් පාරිශුද්ධත්වයට පත් වූ භූමි ප්‍රදේශයක මෙම ථූපාරාම දාගැබ පිහිටා තිබේ.

පොළෝ මට්ටමෙන් අඩි 11 1/2ක් උස කවාකාර වේදිකාවක් මත ථූපාරාමය පිහිටා තිබේ. මෙම කවාකාර වේදිකාවේ විෂ්කම්භය අඩි 164 අඟල් 6 කි. චෛත්‍යයේ විෂ්කම්භය අඩි 59ක් වන අතර උස අඩි 63 කි. සෙල්ලිපිවල ථූපාරාමය හඳුන්වා ඇත්තේ " තුඹරුප් වෙහෙර" යනුවෙනි. එකල ථූපාරාමය ධාන්‍යාකාර හැඩයෙන් යුක්ත වූ බව විශ්වාස කෙරේ. වර්තමානයේ දක්නට ඇත්තේ වර්ෂ 1862 ප්‍රතිසංස්කරණ අවස්ථාවේ දී නිර්මාණය කළ ඝණ්ඨාකාර ස්වරූපය යි.

## ලෝවාමහාපාය

ලෝවාමහාපාය යනුවෙන් හැඳින්වෙන්නේ මහා විහාරයේ පොහොය ගෙය යි. ශ්‍රී මහා බෝධියත්, රුවන්වැලි මහා සෑයත්, අතර නැගෙනහිර පැත්තට බරව ලෝවාමහාපායෙහි නටබුන් පිහිටා තිබේ. එක් පේළියකට මහා ගල් කුළුණු 40 බැගින් පේළි හතළිහක මුළු ගල්කණු සංඛ්‍යාව 1600 කි. දැනට පෙනෙන අන්දමින් එම ගල් කණු සිටුවා ඇත්තේ මහා පරාක්‍රමබාහු රජුගේ නියමය පරිදි ය. ගල්කණු තිබෙන භූමිය හරි හතරැස් වෙයි. යටින් ඇති අත්තිවාරම එක් පැත්තට අඩි 200 බැගින් වෙයි. මුල් ලෝවාමහාපායේ පළල අඩි 200ක් විය.

මෙය ලෝවාමහාපාය නම් වූයේ දුටුගැමුණු රජුගේ කාලයේ දී ය. ඒ නව මහලක් ඉදිකොට වහල තඹ උළුවලින් සෙවිලි කොට තිබූ නිසා ය. මෙම ලෝවාමහාපාය දෙවනපෑතිස් රජු විසින් ඉදිකරවන ලද අතර පසුව එය දුටුගැමුණු රජු විසින් නවමහල් කොට විශාල කරන ලදී. මහාවංසය සඳහන් කරන පරිදි මෙහි යට මාලයේ මාර්ගඵල නොලත් පෘථග්ජන භික්ෂූන් වහන්සේ ද, දෙවැනි මහලේ ත්‍රිපිටකධාරි භික්ෂූන් වහන්සේ ද, තෙවැනි සතර වැනි හා පස්වැනි මහල් හි පිළිවෙලින් සෝවාන් , සකෘදාගාමි, අනාගාමි භික්ෂූන් වහන්සේ ද, පස්වැනි මහලේ නව වැනි මහල දක්වා රහතන් වහන්සේ ද වැඩ සිට ඇත. මෙහි ඉතා මෑතක දී ගල් කණු මත තනි මහලකින් යුත් පොහොය ගෙයක් තනවා තිබේ.

# පවිටු මාරයාට පාඩමක්



විහාරාධිකාරී, ශ්‍රී සුභද්‍රාරාම විහාරස්ථානය, පුරුදුවැල්ල, කුඩාවැව.
**කළුවච්චිමුල්ලේ ධම්මරක්ඛිත හිමි**

**අප බුදුරදුන් සැවැත්නුවර වැඩවසන කාලයේ එමනුවර සුරම්බට්ඨ නම් තැනැත්තෙක් වාසය කළේ ය. ඔහු මිසදිටු අයෙකි. දිනක් බුදුරජාණන් වහන්සේ ඔහුගේ නිවසට පිඬුසිඟා වැඩියහ. බුදුරදුන් දුටු සූරම්බට්ඨ සමීපයට ගොස් නමස්කාර කොට බුදුරදුන් තම නිවසට වැඩමවා අසුනක් සකස් කර එම අසුනේ වැඩ හිඳුවා දනය පිළිගැන්විය.**

දානය වළඳා අවසන් වූ පසු බුදුරදුන් සුරම්බට්ඨට දහම් දෙසීය. දහම් අසා ඔහු සම්‍යක්දෘෂ්ටිකයෙක් විය. තුනුරුවන් කෙරෙහි පැහැදීම කිසිම අයකුට සොළවන්ට නොහැකි විය. බුදුරජාණන් වහන්සේ සූරම්බට්ඨට දහම් දෙසා ආපසු විහාරයට වැඩම කළ සේක.

පවිටු මාරයා සූරම්බට්ඨගේ පැහැදීම දැක දෙතිස් මහා පුරුෂ ලකුණුවලින් යුක්ත බුදුරදුන්ට සමාන රූපයක් මවාගෙන සූරම්බට්ඨගේ නිවසට ගියේ ය. බුදුරදුන් නැවත හදිසියේ ම වැඩියේ හදිසියකටද?" කියා ඔහු ඇසුවේ ය.

"ස්වාමිනි මෙසේ වැඩියේ ඇයි'ද" එවිට මාරයා මෙසේ ප්‍රකාශ කළේය. සූරම්බට්ඨ මම ඔබට දහම් දෙසන විට සියලු පංචස්ඛන්ධයන් අනිත්‍ය වන්නේ ය. දුක්ඛ වන්නේ ය. අනාත්ම වන්නේ ය යනුවෙන් වදාළා. එහෙත් නිත්‍ය වූ, සදා කාලික වූ, සැප වූ පංචස්ඛන්ධයක් ද ඇත. මුලින් වදාළ දේ පිළිනොගන්න."

බුදු දහම් අසා සම්‍යක් දෘෂ්ටියට පත් වූ සූරම්බට්ඨගේ තුනුරුවන් කෙරෙහි ඇතිකරගත් පැහැදීම නැති කරන්නට මාරයා ගත් උත්සාහය නිෂ්ඵල විය.

මාරයා බුදුරදුන්විරුද්ධව ප්‍රකාශ කරන බැවින් ඒකාන්තයෙන් ම "ඔබ මාරයා" දැයි ඇසීය. එවිට මාරයා "එසේ යැයි" පිළිතුරු දුන්නේ ය. "නුඹ වැනි මාරයින් දහසකට මා තුනුරුවන් කෙරෙහි ඇති කර ගත් පැහැදීම වෙනස් කරන්නට නොහැකි ය. මාගේ නිවසින් වහා පිටවෙවයි සූරම්බට්ඨ සිටුවරයා පවිටු මාරයාට කීවේ ය. එය අසා මාර තෙමේ අතුරුදහන් විය.



# ගත සිත පුබුදන පින් වැඩෙන පින්කම්



සද්ධර්ම කීර්ති ශ්‍රී සාසන විභූෂණ, ශාස්ත්‍රපති
**හාතියල්වල චන්ද්‍රනන්ද නා හිමි**

**මිනිස් වර්ගයා පමණක් නොව ලොව සෑම ජීවයක ම ප්‍රාණ වායුව රැඳී ඇත්තේ ගහකොළ, ඇළ, දෙළ, ගංගා, හිරු සඳු එළිය හා බැඳුණු ස්වභාවික පරිසර පද්ධතිය තුළ ය. එය පරම සත්‍යයකි. ගහකොළ, ජලය සුරැකෙන පරිදි ගස්වැල් සිටුවීම, වැව් අමුණු ළිං සැකසීම නිතර පින් වැඩෙන පින්කම් ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළේ පරිසරය හා ජීවීන් අතර ඇති අත්‍යන්තයෙන් බැඳී පවත්නා මේ සබඳතාව මැනවින් වටහාගෙන ය.**

මන්ද මිනිසා ද සොබා දහම ම වන බැවිනි. හින්දු ජනයා වසර හයදහසකට වඩා ඉපැරැණි ඍග්වේදයේ සඳහන් ගීතිකාව මන්ත්‍රයක් ලෙස අද ද භාවිත කරති. එහි අදහස වන්නේ 'ස්වභාව ධර්මය නැමති මහා දේවයෙනි ඔබ සදා ප්‍රාඥය, සදා ආශිර්වාදාත්මක ය. අපි ඔබේ ප්‍රභා මහිමය සම්භාවනා කරමු. උත්තරීත්වය කරා අප යන මේ ගමනේ දී අපට මඟ පෙන්වනු මැනවි. සත්‍යය හා අසත්‍යය වෙන්කර හඳුනා ගැනීමට අපට හැකි වේවා.

මේ ගීතිකාව මනුෂ්‍යයා හා මුළු සොබාදහම හා විශ්ව බලය අතර පවතින පවිත්‍ර සබඳතාව මොනවට කියා පාන්නේ ය.

දූවිල්ලෙන් වූ නුඹ දූවිල්ලට ම යන්නෙහි ය. යනුවෙන් බයිබලයේ සඳහන් පාඨයෙන් ද විශද වන්නේ මිනිසා ස්වභාව ධර්මයේ ම එක් විශිෂ්ට නිර්මාණයක් පමණක් බවයි. මේ කරුණුවලින් සොබාදහම අගයන මිනිසා අතර පැවතිය යුතු යහපත් වූ බැඳීම කෙතරම් විය යුතු ද යන්න අපට මනාව විශද කරයි.

පිරිසුදු වාතය හා ජලය ස්වභාව ධර්මයෙන් අප ලද විශිෂ්ට ම දායාදයන් වේ. මිනිසාට ඔක්සිජන් වාතය නොමැතිව ජීවත්විය හැකි වන්නේ මිනිත්තු හතක් වැනි කාලයක් වන අතර, පිරිසුදු පානීය ජලය නොමැතිව ජීවත් විය හැක්කේ දින හතක් පමණක් වන බැවිනි.

කෙනකුගේ ජීවිතයට වැදගත් ම වන දේ කුමක් දැයි ඇසුවහොත් එක් එක්කෙනා විවිධ වූ පිළිතුරු සපයයි. එහෙත් අමතක නොකළ යුතු ම අපේ ජීවිතයට වැදගත් ම දේ වන්නේ ආශ්වාස ප්‍රශ්වාසයට ඇවැසි අම්ලකර වාතය යි, යන්න දන්නේ කීයෙන් කී දෙනෙක් ද? ඒතරමට ම වත්මන් අතිධාවනකාරී අස්වාභාවික කෘත්‍රිම මිනිසා ස්වභාව ධර්මයෙන් ඈත් වී ඇත.

වාතයට හැඩයක්, පාටක්, හෝ සුගන්ධයක් නැත. නමුත් එය අපිට ජීවය සපයයි. මිනිසා ඇතුළු සමස්ත ජීවී පද්ධතියට ම ප්‍රාණ වායුව සපයා දෙන නිෂ්පාදනාගාරය වන්නේ ගහ කොළ බව නිතර සම්මා සතිය තබාගත යුතු ය. අතීත මිනිසා දැන හෝ නොදැන කළ වෘක්ෂ වන්දනාව මෝඩ අමනෝඥ ක්‍රියාවක් සේ බැහැර කළ නූතන මිනිසා කිසිම හිතක් පපුවක් නොමැති ව කරන වන විනාශය විශ්වයේ ජීවීන්ගේ පැවැත්මට සුවිශාල තර්ජනයක් සිදුකර ඇත. ඔක්සිජන් නිෂ්පාදනාගාර විනාශ කරමින් අනාගත දරු පරපුරට ප්‍රාණඝාතය උරුම කර ඇත. මේ තත්ත්වය වෙනස් කිරීමට මුළු ලෝක ප්‍රජාවම නැඟී සිටිය යුතු කාලය එළඹ ඇත. මනුෂ්‍යයා තුළ ජීවීන්ගේ පැවැත්මට සුවිශාල මෙහෙවරක් ඉටුකරන ඊළඟ සාධකය වන්නේ ජලය යි. ලෝකයේ හතරෙන් තුනක් ජලයෙන් පිරී පවතී. එහෙත් පානයට යෝග්‍ය ජලය ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි. මනුෂ්‍ය ශරීරයේ ද තුනෙන් දෙකක් ජලයෙන් පිරී පවතී. ජලය අපගේ ජීවයේ පැවැත්මට කෙතරම් අවියෝජනීය ලෙස බද්ධව පවතී ද යන්න ඉන් මනාව විශද වේ.

ස්වභාවධර්මය කෙතරම් ආශ්චර්යය ද? පෙර අපර දෙදිග සරල හා ශාස්ත්‍රීය සංගීත ස්වර නාද රටා නිර්මාණය වී ඇත්තේ ද ස්වභාව ධර්මයේ නියාමයන්ට අනුව ය. කුරුල්ලන්ගේ නාද, සතුන්ගේ විවිධ හඬ, ඇළ දොලෙහි හඬ, ගල්මත, කොළමත පතිතවන වැහි බිඳුවලින් නැඟෙන නද, අහසේ ගිගුරුමෙන් ආදී ස්වභාව ධර්මයේ නාද තුළින් කෘත්‍රිමව නිර්මාණය කරගත් ඒ සංගීත ස්වරවලට වඩා ස්වභාව ධර්මයේ නිසල වන වදුලක නාද රටා අසන ඔබට කෙතරම් චමත්කාර ආස්වාදනීය බවක් විඳගත හැකි ද, ඒ සඳහා ඇවැසි පරිසර පද්ධති ලෝකයාට දායක කරන්නට අප කැප විය යුතු ය.

නූතන මිනිසා සිය ආහාර රටා නිර්මාණය කරගෙන ඇත්තේ ස්වභාවික ආහාරවලට වඩා කෘත්‍රීම කෙටි ආහාරයන් ය. හිපොක්‍රටිස් සඳහන් කර ඇත්තේ ස්වභාව ධර්මයේ නිර්මිත ස්වභාවික ආහාර ඔබට ගත හැකි හොඳම ඖෂධය බවයි. ඊට අමතරව ස්වභාව ධර්මයේ හිමි හිරු එළිය, සඳ එළිය හා කළුවරත් විඳගත යුතු ය.

සරල සංයම අභ්‍යාස, යෝග අභ්‍යාස ප්‍රාණයාම අභ්‍යාස හා භාවනා මඟින් කරනු ලබන්නේ ස්වසන ක්‍රියාවලිය නිවැරැදි කිරීම යි. එහෙත් දියුණු යැයි කියන නූතන බොහෝ ජාතීන් සිය ස්වස්න ක්‍රියාවලිය පිළිබඳ නිවැරැදිව අවබෝධයක් නොමැති සේ ක්‍රියා කරයි.

සියටැල් ප්‍රකාශකර ඇත්තේ සුදු මිනිසා තමා ආශ්වාස ප්‍රශ්වාස කරන, වාතය පිළිබඳව නොදන්නකු බවත් මියැදෙමින් සිටින අයවලුන් මෙන් ඔවුන් සුළඟේ සුවඳ නොදන්නා බවත් ය. මේ සියලු කරුණු තුළින් අප අවබෝධ කර ගත යුතු දේ වන්නේ ස්වභාව ධර්මයට අප ඒකාත්මික විය යුතු යන්න යි. ස්වභාව ධර්මය හා බද්ධ වී සිටිය යුතුය යන්න යි.

ඒ වෙනුවෙන් දැනුම ලබාදීම, පරිසර පද්ධති නිර්මාණය කිරීම, පරිසරය විඳගැනීමේ අවස්ථා සුලභ කිරීමට, අප කැපවිය යුතු ය. ඒ සඳහා ඇපකැප වීම සුවිසල් පින්කමකි. ලෝකයාට කරන උපකාරයකි. එය අගනා බුද්ධ පූජාවකි.



## සඳරැස් වැටිලා දෙව්රම් වෙහෙරට

පුංචි කුමාරියො පුංචි කුමාරයො වටකරගෙන පුන්සඳ වාගේ
හිනැහෙන ලස්සන දුටුවම කවුරුත් දෙපයක් එතැනින් යළි නෑගේ
පින උතුරන්නට නිවන් දකින්නට පොඩි වුණමුත් සිත ඇත මාගේ
එක බණ පදයක් අහන්න ආසයි සිත සතුටින් මාගේ

සඳ රැස් වැටිලා දෙව්රම් වෙහෙරට මලුව පුරා මල් වැහී වැහැලා
එක එක මල්පෙති උඩට නැඟී ගෙන මී මැස්සන් ඇත එහි පිරිලා
පිනක් නොමැතිමුත් අපට අහන්නට උන්ටත් පුරුදුයි බණ අහලා
දම්සක් දෙසුමක් අපට දෙසන්නකො පුදදෙමි තුන් සිවුරක් මහලා

පින්කෙත උතුරා ගලා හැලෙද්දී කරුණා දහරින් නැහැවෙනවා
කියන කියන බණ පදයක් ගානේ මා සිත තුළ මල් පිපී දෙනවා
තණ්හා ආසා මෝහයෙ ගිනිදැල් එක මොහොතින් නිවී නිවී යනවා
පෙර පින් මදි බව මට වැටහෙනවා සසුනෙහි පැවිදිව මෙහෙණක් වෙනවා

**ජයසේකර රාජපක්ෂ**
**දිවුරුම්ගම නුගතලාව**



## සසරින් මිදී

රහතුන්ගේ මන
වීතරාගී වින
ධර්මය දෙසූ දන
එය වෙයි උතුම් පින

මුනිඳුට මල් පහන් පිදූ
සැම වෙත පින් වේ ය සිදු
රහතුන් ඒ කෙලෙස් සිඳූ
ඝොර සසරින් ඔවුහු මිදූ

**අජිත් වික්‍රමනන්ද**
**වීරසූරිය**

## බුදුසරණ පුවත්පත

බෝපත් සිලිසිලි නාදෙන් පවසයි බුදු ගුණ
විහාරයෙන් අපට ඇසෙයි සම්බුදු බුදු බණ
ලොවම එළිය කරන මැණික් පහනක් විලසින
"බුදුසරණ" පුවත්පත වඩවයි ගුණ නැණ

**අලුත්වත්තේ සුගතරතන හිමි**
**ශ්‍රී බෝධිරාජාරාම විහාරය, ගලේවත්ත, අකරගම**

## පොසොන් සඳ



දහසක් පිරිස සහ රජුටත් එක ලෙසට
සැනසුම ලැබුණි තෙරුවන් සරණින් සැමට
රහසක් නැතුව ලද ඒ පොහොයෙ නමට
අහසේ පොසොන් සඳ පායා එයි හැඩට

යහ හාෂාව සිරිතට විරිතට අනුව
වහ වහ දනන් ගුණ ගරුකව දැහැමි කොට
මහ සෑ පිළිම හෙළ බොදු සිත් පුබුදු වට
කහවත විකුම් පෑවේ දින පොසොන් සිට

සම මෙත වඩා හැම සත දුක කරන නිමී
අම මහ නිවන් මඟ පහදා හැඳින ගමී
එම මඟ දෙසුව හද කරුණා ගුණෙන් තෙමී
නමදිමි පොසොන් දා අනුබුදු මිහිඳු හිමී

**විශ්‍රාමලත් පරිවේණාචාර්ය**
**පී.බී. ගුණරත්න.**

## හිමි පා පියුම් වඳිනෙමි මම සැදැහැයෙනි



තිසරණ සරණ ගෙන දහමට අනුව යමින්
අසරණ සරණයට නිරතුරු පුරුදු වෙමින්
හිස මත තිබෙන ඉසිකෝමන් ඉවත ලමින්
සසරෙහි ගමන කෙටි කර ගෙන ලබමු නිවන්

කවියෙන් කියන බුදුගුණ ගී අසා බැතින්
වරදින් පවින් නිරතුරුව ම ඉවත යමින්
දැහැමෙන් සෙමෙන් කරමින් දිවි ගමන යෙහෙන්
සසරින් මිදෙන හැටි සොයමු ද වෙහෙස වෙමින්

**වැලිකල - ලක්ෂ්මන් කළුබෝවිල**

## පහන් සිතක කවි



**සංස්කරණය**
**දීපා පෙරේරා**

## නමදිමු බුදුහිමි

අතරක් නැතිව දුක් විඳිනා දිවි කතරේ
සයුරක් ලෙසින් සැරි සරනා බව අඳුරේ
තව දුක් විඳිනු කුමට ද මඟ ඇත අතරේ
දහමක් දෙසූ හිමි ගුණ දසතම පැතිරේ

ඉපදී රුකක් මුල බුදු වී රුකක් මුල
ලැබ දී දස දහස් සතහට නිවන් පල
කර දී නිමා හතළිස් පස් වසක් තුළ
සමු දී පිරිනිවිනි මාහිමි රුකක් මුල

ඇතිවන සියලු දේ නැතිවී යන අයුරු
නියත සැබෑ දහමක් පෙන්වා මියුරු
තෙත් වුණ හදින් මෙත් කරුණා ගුණ පැතිරූ
බැතියෙන තිලෝ ගුරු හිමි නමදිමු මහරූ

**පී. ප්‍රේමසිරි ඩයස්**



## දුබල සිතට

කිරි සුවඳ දැනෙනවා
රාගයෙන් වැහෙනවා
ලෝ දහම නසනවා
සසර දුර රැඳෙනවා
සදා සැනසුම වැසෙනවා

**කිතුල්ගල**
**රත්නසේකර රූපසිංහ**

## දුවේ පුතේ

දහමින් දැකිය හැක බුදුහිමි දුවේ පුතේ
අපි හැසිරෙමු දහම් මඟ හිත දිවා රැයේ
සසර බිය දැනෙයි බෙහෙවින් සිතට මගේ
පින්කම් කරමු ළඟ නැතුවත් අතේ සතේ

වියපත් ජීවිතේ ගත වීරිය බිඳුණ
හැකි වේ ජය ගන්න කළ විට මන දමන
කරුණා පිරුණු සිසිලෙන් අප හද තෙමන
මඟ යා යුතුයි සම්බුදු හිමි දෙසූ නිවන

**අජිත් වික්‍රමනන්ද වීරසූරිය**
**මොරගොල්ල, ඉඹුලගස්දෙණිය**

## පින් සිතක්

නිමක් නැති ගමන යන
අතර මඟ තවම එන
පැමිණ විගසින හැරෙන
කළුළු කැට තුළ දැවෙන

පින් සිතක් නැති මිනිසා....

වෙනස කොතැන ද
නතර වන්නට
සොයන්නෙ ද මිනිසා
ආශා සිත් ගෙන
බැඳී හඬනා
සසරෙ මේ මිනිසා

කළුළු නිමකර
සැනසුමක් වෙත
මඟක් ඇත සසරේ
උතුම් ගතියෙන්
දහම් මඟ යන
මලක් සේ මිනිසා

සසරෙ බැඳෙනා
මුළාවෙන් මිදී
ලෝභ සිත් බිඳ දා
උතුම් නිවනේ
සුවය විඳිනා
පින් සිතක් ඇති මිනිසා

**නීතිඥ කීර්ති කපුවත්ත**
**රිදීගම**

## හෙළ දන හදවත සියපත් පිපුණා

පිපී නිවන් මල් අඹ රුක් අරණේ
නිවුනි දනන් සිත් මේ හෙළ දෙරණේ
මෙත් ගුණ ගැඹිබර මේඝ වළාවෙන්
වට මහ තෙරුවන් ගුණ වරුසාවෙන්

ගලා සතර අත වට මහ දිය කඳ
ගියා මුළා මළ සේදී මුහුදට
එකමුතු බැමි බැඳ මෙත් මුතු රැස් කොට
වැපිරුණි ගුණදම් සිත් කෙත හැඩ කොට

අහස උසට බැති සිත පැන නැගුණා
ලොවිතුරු ගුණ කඳ සෙල් මත මැවුනා
කලා ශිල්ප දිවි මඟ හැඩ කෙරුණා
හෙළ දන හදවත සියපත් පිපුණා


**ඩබ්. විජේන්ද්‍ර සමරසුන්දර**
**හම්බෙගමුව**

## බුදුසරණ පහන් සිතක කවි

BCC

සම්පූර්ණ නම :- ..............................................
ලිපිනය :- ..............................................
දුරකථන අංකය :- ..............................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.



දුටුගැමුණු මහ රජතුමා

70 කොටස

# විජිතපුර බලකොටුවේ ආරක්ෂාව තර කරන්න

"අපි දහවල් ආහාරයට විජිතපුරයට යනවාද? නැතිනම් කසාතොට යුද කඳවුරෙන් ආහාරය ගෙන දිගටම අනුරාධපුරයට යනවාද?"

"මහ සෙනෙවිතුමනි, මගේ සිත තුළ තවම තිබෙන්නේ පරාජිත හැඟීමක්. ඔවුන් මට හිංසා පීඩා නොකළත්, මා වෙනුවෙන් වන්දි ලබා ගැනීම මට ඉවසුම් දෙන්නේ නැහැ. ඒ නිසා විජිතපුර රැඳෙන්නට මගේ කැමැත්තක් නැහැ. අපි කසාතොටදී දහවල් ආහාරය ගනිමු. ඉන්පසු දිගටම අනුරාධපුරයට යමු."

ඉර බැස ගොස් පැය දෙකකට පමණ පසු මහ සෙනෙවිවරුන් දෙදෙනා අනුරාධපුරයට පැමිණියහ. මද විවේකයක් සඳහා මිත්‍ර මහ සෙනෙවිගේ තානායමට ළඟා වූහ. ඒ සමගම දීඝාභය ද පැමිණියේ ය.

"රජ මාලිගයට පැමිණ එතැනින් යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවට ගියා. ආපසු යන ගමන් සිරිනාග ගැන සොයා බලන්නට සිතුණා. ඒ නිසා යි මෙතැනට පැමිණියේ.

"අද රාජ සභාවට පැමිණීමටයි බලාපොරොත්තුවෙන් හිටියේ. ඒත් සිරිනාගගේ ගමන් වෙහෙස නිසා එය හෙටට කල් දැම්මා.

"ගනුදෙනුවලට කාලය ගත වුණා. තුණ්ඩිලගේ සිද්ධිය ගැන ඛඤ්ජදේවට අපේ රජයේ කනගාටුව පළ කළා. දහවල් ආහාරය කසාතොට දී අරගෙන දිගටම මෙහි පැමිණියා."

කතාබස් කරමින් ආලින්දයට පැමිණි ඔවුන් දුටුවේ මිත්‍ර මහ සෙනෙවිගේ අස්රියෙන් එන සෙනෙවි බිරිඳ ය. අස්රියෙන් බැස ගත් ඇය වෙත ගිය සිරිනාග වැඳ නමස්කාර කර ඇය කැටුව ආවා ය.

දීඝාභය, දීඝජන්තු මහ සෙනෙවිවරු දෙදෙනා ඉතා ගෞරවයෙන් ඇයට ප්‍රතිචාර දැක්වූහ.

"පුතාගේ ප්‍රමාදය ගැන බියට පත් අම්මා පුතා එන මගට ම ආවා" දීඝාභය සිනාසෙමින් කීවේ ය.

ඇත්ත මග බලාගෙනමයි හිටියේ. ඒ අතරතුර පරවියකු හසුන්පතක් ගෙනාවා. සිරිනාග මෙහි ඇතැයි සිතූ නිසා එයත් රැගෙන මෙහි ආවා."

"හසුන් පතක්? පරවියකුගෙන් ලැබුණු මේ හදිසි පණිවිඩය කුමක්ද? මෙය මාගමින් එවූ හදිසි තල්පතක් විය යුතුයි. සිරිනාග තමාටම කියා ගත්තේ ය.

රෙදි කඩක එතූ හසුන්පත අතට ගත් සිරිනාග පරිස්සමෙන් ඉටිරෙදි කැබැල්ල ලිහා තල්පතක් අතට ගත්තේ ය. මහ සෙනෙවිවරු දෙදෙනා බලා සිටියේ මහත් කුහුලකිනි. තල්පත කියවා බැලූ සිරිනාග එය දීඝාභයට දුන්නේ ය. "කියවන්න මහ සෙනෙවි තුමනි"

"දුටුගැමුණු බළ හමුදා ගමන් ඇරැඹුවා. ප්‍රධාන මාර්ගවලින් නොපැමිණ රහස් අතුරු මාර්ගවලින් ඇවිත්, සියලු තොටමුණු මඟහැර මහවැලි ගඟින් එතෙර වන්නට තීරණය කළා."

"ගැමුණු රජතුමාගේ සේනාව ලක්ෂයකට වඩා නැහැ. බාහිර රාජ්‍යවලින් කිසිදු සහයක් ලැබී නැහැ."

දීඝාභය තල්පත කියවාගෙන ගියේ සිහිකල්පනාවකින් තොරව ය. ඔහු වික්ෂිප්තව සිටියේ ය. දීඝජන්තු හොඳින් ඇහුම්කන් දීගෙන සිටියේ ය.

"මේ රහස් තල්පතේ කරුණු පිළිබඳ අපේ විශේෂ අවධානය යොමු කළ යුතුයි. අපේ සංවිධාන සැලසුම් තරමක් වෙනස් කරන්නට සිදුවේවි. විජිතපුර බලකොටුවට හදිසි පහර දීමක් වෙන්නට පුළුවන්" දීඝජන්තු කීවේ ය.

"කුමන අවස්ථාවක හෝ කුමන දිශාවකින් ඇවිත් පහර දුන්නත් ඔවුන් පළවා හරින්නට අපට පුළුවන්. එකම සතුරු සෙබලකුටවත් විජිතපුර බලකොටුවට ඇතුළු වන්නට අප ඉඩ දෙන්නේ නැහැ." දීඝාභයගේ පිළිතුරු විය.

"දීඝාභය අනුරාධපුර ආරක්ෂාව රැදෙන්නේ විජිතපුර බළකොටුවෙන්. ඒ නිසා අද සිටම එහි ආරක්ෂාව දැඩි කළ යුතුයි.

"කලබල විය යුතු නැහැ. ඔය පිරිසට මෙහි එන්නට තවත් මාසයක් හෝ දෙකක් ගතවේවි. මෙගොඩ ඉවුරේ සැක සහිත ස්ථානවල සේනාව රඳවමු.

"සිරිනාග අපි අදම රජතුමා හමුවන්නට ඕනෑ. හෙට රාජ සභාවෙන් පසු යුද්ධ මණ්ඩලය කැඳවමු. රජතුමා හමුවීමේ අවස්ථාවට දීඝාභයත් පැමිණිය යුතුයි."

"බැහැ, අද යුද සරඹ සන්දර්ශනයක් යෙදී තිබෙනවා, ඒ නිසා ඉර බැස යන්නට කලින් මම කඳවුරේ ඉන්නට ඕනේ. හෙට රාජ සභාවට ඉදිරිපත් කරන කරුණු සැලසුම් කර ගන්නටත් තිබෙනවා."

"හොඳයි, එහෙනම් අපි විසිර යමු. හවස පහට අපි රජතුමා හමුවෙමු." සිරිනාග තමන්ගේ ගමන් විස්තර හා මාගම විස්තර කෙටියෙන් බෝධිනාගට හෙළි කළේ ය.

"පියාණෙනි, ඉතාම විමසිලිමත්ව සිටින්න. පිටතින් මෙන්ම නුවරින් එය අය ගැනත්, සම්මන්ත්‍රණ ශාලාවට එක්රැස් වී කරන කතාබහ ගැනත් සැලකිලිමත් වෙන්න. මගේ අශ්වයා මෙහි තබා යනවා. ඔහුට හොඳින් සාත්තු කරන්න. සවස සෙනෙවි මැදුරට ගෙන එන්න. මම මෑණියන් සමඟ වෙනත් අස්රියකින් යනවා.

සමන්ති මෑණියන් සමඟ මැදුරට පැමිණි සිරිනාග මදක් සැතපිණි. ඉන් පසු මුහුණ කට සෝදාගෙන ගමනට සූදානම් විය.

"මෑණියනි, මම දැන් ජයනාථ මහ සිටු මැදුරට යනවා. ඉන්පසු රජ මාලිගයට ගොස් අඩ හෝරාවක් පමණ එහි රැඳෙනවා. ඉන්පසු ජය ශ්‍රී මහා බෝ සමිඳුන් වැඳ පුදා ගෙදර එනවා."

බෝධිනාග විසින් ගෙන එන ලද අසු පිටට නැඟි සිරිනාග විනාඩි කිහිපයක් ඇතුළත මහ සිටු මැඳුරට ළඟා විය. මහ සිටුතුමාත්, සිටු දේවියත්, දියණියත් ආලින්දයට වී බලා සිටිනු දුටු සිරිනාගට හැඟුණේ ඔවුන් තමාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටින බව ය.

එන්න සිරිනාග, ඔබ ප්‍රමාද වූයේ ඇයි? අපි මග බලා සිටියේ දිවා ආහාරයත් සූදානම් කරගෙන" සිටු දේවිය කීවාය.

මෑණියනි, කසාතොට දී ප්‍රමාද වුණා. චරපුරුෂයන් එකසිය පනස් දෙනකුගේ අනන්‍යතාව තහවුරු කර ගනිමින් භාර ගන්නට පැය තුනකටත් වඩා වැඩි කාලයක් ගත වුණා. ඒ සෝදිසිය ඉතාමත් හොඳයි. අවස්ථාවෙන් ප්‍රයෝජනය ගනිමින් අපේ චරපුරුෂයන් කිහිප දෙනෙකුත් ඇතුළු කරගන්නට ඉඩ ලැබුණා."

"සිරිනාග, මාගමින් ආවේ කවදා ද? අද හිමිදිරියටත් කලින් පිටත් වුණා. දාඨාසේන තවත් අසරුවන් දස දෙනෙක් සමගින් මා රැකවල් කරගෙන ආවා" යි කියමින් සිරිනාග සිනාසුණේ ය.

සිරිනාගට මරණ දඬුවම පනවා ඇති බව ආරංචි වුණාම අප බොහෝ භයට පත් වුණා. නමුත් අප සැබෑම තොරතුරු දැන ගත්තේ මහනෙලගෙන්.

"ඔව් පියාණෙනි, මෙහි එන්නට කලින් මට මහනෙල හමුවුණා. මෙහි සියලු තොරතුරු ඔහුගෙන් දැන ගත්තා" යි කීවේ ය.

"අමිතාටත් යුද බිමට යන්නට ඕනෑ වෙලා" සිටු දේවිය කීවා ය.

"දුටු ගැමුණු රජතුමා පරාජය කරන්නට ද?"

"නෑ, දිනවන්නට"

"නැඟණියනි, අපේ අරමුණු විවෘතව කතා කිරීමට තවම අවස්ථාව උදා වී නැහැ. ඒ නිසා පරිස්සමින්; ඉදිරියේ දී අවදානම තවත් වැඩිවේවි. දුටුගැමුණු රජතුමා දැන් මාගමින්, කතරගමටත්, කතරගමින් ගුත්තාහල කඳවුරටත් ඇවිත්. අප කළ යුතු දේ බොහෝයි.

සිටු මන්දිරයේ සියල්ලන්ගේ ම මුහුණුවල ඇති වූයේ මහත් සතුටකි. "යුදබිමට කාන්තා හමුදා කණ්ඩායම් කිහිපයක්ම එනවා. පෙරමුණේ ම එන්නේ විහාර මහා දේවීන් වහන්සේ" යි කියමින් අමිතා සිනාසුණා ය. ඔව්, ඒ එක්කම සීවලී, සමන්තා මහිලා යන කුමරියන් තිදෙනාත් එනවා.

සමන්තා අශ්ව ශිල්පයට දක්ෂයි. අවි හරඹත් පුළුවන්. කඩුව, හෙල්ල, දුන්න ආයුධ පරිහරණයේත් සමත්කම් දක්වනවා. ඇය වඩාත් කැමති දුර්ගම සංග්‍රාම පුහුණුවට" සිටු දේවිය කීවා ය.

"කතාබහ කරන්නට බොහෝ දේ තිබෙනවා. සිරිනාග හෙට වේලාසනින් එන්න. රාත්‍රී භෝජනයත් අරගෙන යන්න පුළුවන්."

සිරිනාග යන්නට සමු ගත්තේ ය.

අයන්ති විතාන